# ව්‍යාප්ති සේවයේ ප්‍රජා සංවර්ධන අංශ

ඩී. තෙන්නකෝන්

## හැඳින්වීම :

පුළුල් දෘෂ්ටියකින් බලන කල්හි ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවයේ පැහැදිලි ක්ෂේත්‍ර කිහිපයක් තිබේ. ආරම්භයේ සිටම ව්‍යාප්ති සේවය යනුවෙන් අවබෝධ කර ගනු ලැබුවේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයයි. වැඩිවන ජනගහනය සඳහා වැඩි වැඩියෙන් ආහාර වගා කිරීමේ අවශ්‍යතාවය වැඩිවත්ම හරිත විප්ලවයත් සමග නවීන තාක්ෂණයේ ප්‍රාතිහාර්යය කෘෂිකාර්මික කටයුතු තුලින් ද ප්‍රදර්ශණය වන්නටවත්ම, වඩ වඩාත් නවීන තාක්ෂණික හා විද්‍යාත්මක දැනීම ගොවියා වෙත ගෙන යාමේ අවශ්‍යතාවය පුළුල් වශයෙන් අවබෝධ කර ගන්නා ලදී. මේ නිසා පසුගිය දශක කිහිපය තුලදීම ව්‍යාප්ති සේවය වශයෙන් අරමුණු වූයේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය පමණි. කෘෂිකාර්මික සංවර්ධනයට පමණක් නොව ඒ තුලින් ගොවි ජනතාවගේ ආර්ථික සමාජයීය සංවර්ධනයත් අපේක්ෂා කරන හෙයින් ග්‍රාමීය මට්ටමේදී ව්‍යාප්ති සේවා කටයුතු විවිධ ක්ෂේත්‍ර වෙත ද පැතිර තිබේ. උදහරණ වශයෙන් ගතහොත් පවුල් සංවිධාන, ජනගහන සැලසුම්, සෞඛ්‍ය හා සනිපාරක්ෂා වැනි ව්‍යාප්ති වැඩ පිළිවෙලවල් කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩ පිළිවෙලවල් වලදී මෙන්ම, කඩිනම් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති වලදී ද ඒකාබද්ධව පවතී.

ග්‍රාමීය සංවර්ධනය සඳහා ඉමහත් ප්‍රයත්නයක යෙදෙන මෙම අවධියේදී, ග්‍රාමීය සංවර්ධන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ජනතා සහභාගිත්වය ලබා ගැනීම පිළිබඳ පොදු ජනතාවට අවබෝධයක් ලබා දීම අත්‍යාවශ්‍ය එකකි. එමෙන්ම, මහජන සහභාගිත්වය ලබා ගැනීමේදී වැඩ පිළිවෙලේ සාර්ථක භාවය කෙරේ පුළුල් ජනතා විශ්වාසයක් ගොඩ නැගිය යුතුය. මෙහිදී ග්‍රාමීය සංවර්ධනයේ යෙදී සිටින ව්‍යාප්ති සේවකයාට මහත් කාර්ය භාරයක් පැවරේ. පළමුව තමාගේ කාර්යභාරය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔහු සතුවිය යුතු අතර, දෙවැනුව ඔහු තමාගේ කාර්යය ඉටු කල යුතුය. මෙහිදී ඔහුට මහජනයා සමග සමීපව කටයුතු කිරීමට සිදු වන නිසා තම කාර්යය ඉටු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේධය පිළිබඳව අවබෝධයක් තිබිය යුතුය. ඔහුගේ කාර්යය, දැනුම ප්‍රජාව වෙත ගෙන යාම බැවින් ඔහුගේ කාර්යය ඉටු කළ යුතුව ඇත්තේ මුළුමනින්ම සංනිවේදන මාධ්‍යයෙනි. මෙම පසුබිම යටතේ සියළුම ව්‍යාප්ති සේවා අංශ පුළුල් වශයෙන් ගෙන සලකා බලා ව්‍යාප්ති සේවයේ ප්‍රජා සංවර්ධන මුහුණුවර පිළිබඳ සරල විග්‍රහයක් කිරීම මෙම ලිපියේ මූලික පරමාර්ථයයි. ග්‍රාමීය සංවර්ධන හෝ වේවා ප්‍රජා සංවර්ධන හෝ වේවා පොදු සංකල්ප ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවකයාට තම කාර්යය සපුරා ගැනීමේදී කොයි ආකාරයෙන් උපයෝගී කර ගත හැකි දැයි යන්න මෙහිදී සැලකිල්ලට භාජනය වේ.

## ව්‍යාප්ති සේවයේ මූලධර්ම

ව්‍යාප්ති සේවය යනු කුමක් ද යන්න එහි න්‍යායික අංශයෙන් නොයෙක් ලෙස විග්‍රහ වේ. එහෙත් ව්‍යාප්ති සේවයට පදනම් වූ මූලධර්මයන් පහත සඳහන් පරිදි විග්‍රහ කළ හැකිය. ව්‍යාප්ති අධ්‍යාපන කටයුතු සහ ව්‍යාප්ති සේවා වැඩසටහන් අධ්‍යාපන හා සමාජ විද්‍යාත්මක මූලධර්ම මත සම්පූර්ණයෙන්ම වාගේ පදනම් වී ඇති බව කිව යුතුය. පොදුවේ සලකන විට ව්‍යාප්ති සේවය යනු ආර්ථික හා සමාජ සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා යොදා ගන්නා ලද වැඩ පිළිවෙලකි. ව්‍යාප්ති සේවයේ ඉතිහාසය දෙස බලන විට එය ආරම්භ වූයේ කෘෂිකාර්මික

සංවර්ධනය සඳහාය. එහිදී ව්‍යාප්ති සේවය තාර්කික, විද්‍යාත්මක සහ ජයග්‍රාහී පිළිවෙලකින් ගොවිපල ඵලදායි කර ගනු වස් ගොවියාට අවශ්‍ය දැනීම හඳුන්වා දෙන ක්‍රමයක් විය. මෙසේ කෘෂිකාර්මික සංවර්ධනය ලබා ගැනීමත් සමගම, ගොවියාට අවශ්‍ය ප්‍රවීණතාවය සහ දැනීම ලබා දෙමින් එමගින් රටේ ස්වාභාවික සම්පත් මනා ලෙස පාලනය කර ගැනීමට වෙහෙසෙන ජනතාවක් බිහි කිරීමේ අරමුණ දෙසට ද ව්‍යාප්ති සේවය අවතීර්ණය වී ඇත. පුළුල් වශයෙන් විග්‍රහ කරන කල ව්‍යාප්ති සේවා කටයුතු, පර්යේෂණ, අධ්‍යාපනික හා ප්‍රචාරක සේවා කටයුතු සමග සම්මිශ්‍ර ක්‍රියාවලියක් වශයෙන් පවතින බව දැක්විය හැකිය. ව්‍යාප්ති සේවා වැඩ සටහනක් තාක්ෂණික සහ ජාතික ආර්ථික අවශ්‍යතාවයන් සේම ප්‍රජා අවශ්‍යතාවයන් ද මත සැලසුම් කරනු ලැබේ. සියළුම මිනිසුන් උසස් ජීවන තත්ත්වයකට කැමතිය. පවතින ප්‍රශ්න නිරාකරණය කරගනු වස් අලුත් මාර්ග වල ඇති වැදගත්කම අවබෝධ වූ පසු මිනිසුන් නව තාක්ෂණයට ඇබ්බැහි වනු ඇත. මේ නිසා ව්‍යාප්ති සේවයේ ප්‍රධානතම කාර්යය නම් නව සහ වඩා උචිත ක්‍රමවල වැදගත්කම ජනතාවට ඒත්තු ගැන්වීමයි. මෙය ව්‍යාප්ති අධ්‍යාපනික සේවයට පදනම් වූ මධ්‍යගත මූලධර්මයයි.

සරළ වශයෙන් හඳුන්වන්නේ නම් ව්‍යාප්ති සේවය අවිධිමත් අධ්‍යාපන පරිපාටියක් වශයෙන් හැඳින්විය හැකිය. එසේ වුවද ව්‍යාප්ති සේවා අධ්‍යාපනයේදී පාසැල් අධ්‍යාපනයේ යම් යම් මූලධර්ම යෝග්‍ය පරිදි අනුගමනය කරනු ලැබේ. ස්වඋත්සාහයෙන් තම ජීවන තත්ත්වය උසස් කර ගනුයේ කෙසේද යන්න පිළිබඳව ගැමියනට අවබෝධයක් ලබා දීම එහි අරමුණයි. මේ සඳහා ස්වාභාවික සම්පත් මනා ලෙස සහ ආර්ථිකව ප්‍රයෝජනයට ගැනීමට ශ්‍රම සම්පත් ඥානාන්විතව මෙහෙයවීම සහ ගෙදර දෙර මනා ලෙස පැවැත්ම ආදී අංශ පිළිබඳව ද ගොවියාට දැනීමක් තිබිය යුතුය. මෙකී වැඩ පිළිවෙලක ප්‍රතිලාභය පෞද්ගලිකව ද, පවුල් මට්ටමින්, ප්‍රජා මට්ටමින් සහ ජාතික මට්ටමින් ද බෙදී යයි. ව්‍යාප්ති සේවා අධ්‍යයන වැඩ සටහන් වලදී උගන්වන කරුණු ඒත්තු ගැන්වීමට සලසනවා මිස ඒ පිළිගැනීමට බල නොකරයි. මේ අනුව ව්‍යාප්ති සේවකයා පූර්ණකාලීන ගුරුවරයෙකි. ඔහුගේ ඉගැන්වීමේ පාඨමාලාවේ සීමාවක් නැත. මෙකී ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති, පුහුණු සහ අධ්‍යාපනික කටයුතු සම්පූර්ණයෙන්ම ග්‍රාමීය ප්‍රජාව වෙත එනම් පිරිමි, ගැහැණු සහ ළමයින් ආදී වශයෙන් සියලු දෙනාම සඳහා මිස වරප්‍රසාද ලත් එක්තරා පන්තියක් සඳහා වෙන් නොවේ. එහෙත් මෙම මූලධර්ම සමහර ව්‍යාප්ති කටයුතු වලදී බල නොපාන බව මතක තබා ගත යුත්තකි. ග්‍රාමීය සංවර්ධනය සඳහා කැප වුණු ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවකයා ග්‍රාමීය ජනතාවගේ ගුරුවරයෙක් වශයෙන් අගය කරන්නේ නම් ඔහු ඉතාම වැදගත් අංශ කිහිපයක් පිළිබඳව ගැමි ජනතාවගේ දැනීම දියුණු කරනු ලබන බව පහත සඳහන් පරිදි වෙන් වෙන් වශයෙන් පැහැදිලි කළ හැකිය.

ව්‍යාප්ති සේවකයා ජීවන තත්ත්වය වැඩි දියුණු කර ගන්නා ආකාරය පිළිබඳව ගොවියාට උපදෙස් දෙයි. මිනිස් සම්පත පස, බෝග, සතුන් වැනි අනෙකුත් සම්පත් වලට වඩා අගනේය. එහෙත් මිනිසාගේ මනා පැවැත්මට ඉහත දැක්වූ අනෙකුත් සම්පත් නැතිවම බැරිය. ගොවියාට මනා ජීවන තත්ත්වයක් සඳහා වැඩි ආදායමක් ඉපැයීමට සිදු වේ. වැඩි ආදායමක් ඉපැයීම සඳහා නිෂ්පාදන ශක්තිය වර්ධනය කළ යුතුය.

ප්‍රජා ගැටළු විසඳා ගැනීමේදී ඔවුන්ගේ ස්වඋත්සාහයම මුල් විය යුතුය යන්න ගොවියා වෙත තහවුරු කිරීමේදී ව්‍යාප්ති සේවකයාට සැහෙන කාර්යභාරයක් ඉටු කිරීමට තිබේ. මුහුණපාන ලද ප්‍රශ්නයට ප්‍රතිකර්මයක් යෝජනා කල විට යෝග්‍ය ප්‍රතිකර්මය හඳුන්වා ගැනීමට බොහෝ ගොවියනට හැකියාව තිබේ. ව්‍යාප්ති කටයුතු මිනිසුන් සමග මිස මිනිසුන් සඳහා නොවේ. මෙයාකාරයෙන් ව්‍යාප්ති සේවකයා ගොවියාට තීරණ ගැන්වීමට සහ ස්ව විශ්වාසය තහවුරු කර ගැනීමට මඟ පෙන්වා දිය යුතු වේ.

අවිද්‍යානුකූල ගොවිතැන් ක්‍රම මගින් ස්වභාවික සම්පත් විනාශ නොකොට මනා වගා ක්‍රම මගින් එකී සම්පත් බුද්ධිමත්ව සහ ආර්ථිකව ප්‍රයෝජනයට ගැනීමෙන් වැඩි ගොවිපල ආදායමක් ලබා ගන්නා ආකාරය ව්‍යාප්ති සේවකයා ගොවියාට පැහැදිලිකොට දිය යුතුය.

එසේම යෝග්‍ය වූ නව සහ කාර්යක්ෂම වගා ක්‍රම ගොවියා වෙත හඳුන්වා දෙනුයේ ව්‍යාප්ති සේවකයාය. තම ගොවිපල කාර්යක්ෂමව සහ ඵලදායිව පවත්වා ගෙන යාමේ ක්‍රමය පිළිබඳව ගොවියාට මඟ පෙන්වා දෙනුයේ ව්‍යාප්ති සේවකයායි.

ගෙදර දෙර කළමනාකරණය සහ ශ්‍රම කළමනාකරණය පිළිබඳව වැටහීමක් ගොවියා තුල තිබිය යුතුය. තම ගොවිපල නිෂ්පාදනය අරපරිස්සමින් පාවිච්චි කරනුයේ කෙසේ ද ? ගෙදර දෙර සනීපාරක්ෂාව, පෝෂණය සහ පවත්නා ජීවන තත්ත්වය උසස් කර ගන්නේ කෙසේ ද යන්න පිළිබඳවත් ගොවියා තුල පුහුණුවක් ඇති කිරීමට ග්‍රාමීය සංවර්ධනය සහ සම්බන්ධ වූ ව්‍යාප්ති සේවා ව්‍යාපෘති වැඩ සටහනක දී සලකා බැලිය යුතුය.

මෙයාකාර ව්‍යාප්ති සේවා පුහුණු සහ අධ්‍යාපන වැඩසටහන් මගින් ගොවියා වෙත ගෙන යන දැනුම පෞද්ගලික, පවුල් මට්ටමින්, ප්‍රජා මට්ටමින් සහ ජාතික මට්ටමින් ආදී වශයෙන් පියවරෙන් පියවර සැලසෙන ප්‍රතිලාභ රටක ඉදිරි ගමනට බොහෝ දුරට හේතු වේ. මීට ඉහතින් සඳහන් කළ පරිදිම ග්‍රාමීය සංවර්ධනයට අදාල ව්‍යාපෘති කටයුතු කෙරෙන වෙනත් සංවිධාන සහ දෙපාර්තමේන්තුවල අරමුණු සහ කාර්යභාරය පිළිබඳවද කෘෂිකාර්මික ව්‍යාප්ති සේවකයා අවබෝධයකින් සිටිය යුතුය. උචිතම දෙය නම් මේ සියළුම ව්‍යාප්ති සේවකයන් තමාගේ දෙපාර්තමේන්තුවට හෝ සංවිධානයට අමතරව අනෙකුත් සංවිධාන සහ දෙපාර්තමේන්තුවල ග්‍රාමීය මට්ටමේ කටයුතු පිළිබඳව මනා වැටහීමකින් සිටිය යුතු බවයි. ව්‍යාප්ති සේවයේ යෙදී සිටින ග්‍රාමීය මට්ටමේ නිලධාරීන්ගේ ප්‍රයෝජනය උදෙසා මීලඟ ඡේදයේ සිට ව්‍යාප්ති සේවයේ ස්වභාවය සහ කාර්යභාරය පිළිබඳව විද්වතුන්ගේ නිර්වචන සමග සාමාන්‍ය විස්තරයක් ඉදිරිපත් කෙරේ. කෘෂිකාර්මික හෝ වේවා, සනීපාරක්ෂක හෝ වේවා ඕනෑම ආකාරයක ව්‍යාප්ති සේවා කටයුත්තක ස්වභාවය සහ කාර්යභාරය ජනසෙත සැලසීමේ තේමාව මත සැකසී තිබේ.

**ව්‍යාප්ති සේවයේ ස්වභාවය සහ කාර්යය :**

ව්‍යාප්ති සේවය යනු පාසැල් අධ්‍යාපනයෙන් පරිබාහිරව ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන කටයුතු වලට සම්බන්ධ, ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට අදාල වන සහ ග්‍රාමීය සුභසාධන සැලසෙන්නාවූ කාර්යයන්, එම ග්‍රාමීය ප්‍රජාවගේ පවතින අවශ්‍යතාවයන් හා අභිලාෂයන් මත පදනම්ව, ග්‍රාමීය ජනතාව සමග ඔවුන් සඳහා ක්‍රියාත්මක වන වැඩ පිළිවෙලකි (මෝෂර් ; 1978). මෙම පදනම මත කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය විග්‍රහ කර ඇත්තේ මෙසේය. ''කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ ප්‍රධානම අභිලාෂය නම් ගොවි පවුල් වලට ගොවිකම් කටයුතු සම්බන්ධයෙන් නව දැනීම සහ ප්‍රගුණතාවය ලබා දෙමින් ඒ මගින් ඔවුන්ගේ පවතින අවශ්‍යතාවය සහ අභිලාෂයන් ඔස්සේ, ගොවිපල නිෂ්පාදන වැඩිකිරීම හා ගොවි පවුල්වල ජීවන තත්ත්වය නංවාලීමයි (මෝෂර්; 1978). මේ අනුව හුදෙකලාවම අපේක්ෂිත සංවර්ධන ඉලක්කයන් කරා ලඟාවීමට ව්‍යාප්ති සේවා වලට නොහැකිය. අනෙකුත් ග්‍රාමීය සේවා අංශද මැනවින් හඳුනා ගත යුතුය. උදාහරණයක් වශයෙන් ගතහොත්, ව්‍යාප්ති අධ්‍යාපනික අංශය එකකි. ව්‍යාප්ති සේවා අංශය අනෙකකි. කෘෂිකාර්මික සංවර්ධනයේදී කෘෂිකාර්මික ආධාර සේවා (Agrc—Supportive Services) කාර්යක්ෂමව පැවතිය යුතුය. මෙම ආධාරක සේවා, කෘෂිකාර්මික දැනීම සහ යෙදවුම් කලට වේලාවට ලබා ගැනීමටත්, අලෙවි පහසුකම් ඇති කිරීමටත් හේතු වේ. මේ නිසා කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය ද අනෙකුත් ආධාරක සේවා සමඟ සමීප සම්බන්ධතාවයක් පැවැත්වීම ඉතාම අවශ්‍යය.

ව්‍යාප්ති සේවයේ ප්‍රධාන කාර්යභාරය නම් සමාජ ආර්ථික සංවර්ධනයට තුඩු දෙන ගොවිතැන හෝ කර්මාන්ත වැනි ශිල්පීය හා අදල විද්‍යාත්මක දැනීම එය දත යුතු ජනතාව වෙත හඳුන්වා දීමයි. ග්‍රාමීය හෝ නාගරික වේවා සමාජ ආර්ථික සංවර්ධනයක ඉලක්කය වෙත ක්‍රමයෙන් පරිවර්තනය කරවනු වස් අවශ්‍ය අංශයන්ගේ ඒකාබද්ධ පුහුණු වැඩ සටහන් පුළුල් දෘෂ්ටියකින් ව්‍යාප්ති සේවා වශයෙන් හැඳින්විය හැකිය. සමාජ සංවර්ධනයේදී ජනතාවගේ සෞඛ්‍යය හා සනීපාරක්ෂාව අරමුණු කොට ඇති ව්‍යාප්ති සේවා, ආර්ථික සංවර්ධනයේදී කෘෂිකාර්මික හෝ කාර්මික සංවර්ධනය අරමුණු කරගත් ව්‍යාප්ති සේවා, ආදී වශයෙන් කොයි යම් ආකාරයක ව්‍යාප්ති සේවා කටයුත්තක් වුවත් පෞද්ගලික මට්ටමින්, ප්‍රජා මට්ටමින් සහ ජාතික මට්ටමින් සංවර්ධනය අරමුණු කරගත් සියළුම සංවිධාන සමග සම්බන්ධීකරණය පැවැත්වීම ග්‍රාමීය සංවර්ධනය කඩිනම් කිරීමට රුකුලක් වෙයි. ඇත්ත වශයෙන්ම ඒ ඒ ආයතන අතරත්, ආයතන සහ මහජනතාව අතරත් දැනීම් හුවමාරුවක් සිදු වන බව මනාව පැහැදිලි ය.[2]

සමාජයීය ආර්ථික හා දේශපාලනික වෙනස්වීම් ජනිත කරවන බොහෝ වූ සාධක සමූහයක ව්‍යාප්ති සේවා එක් සාධකයක් පමණක් බව මෙහිදී තරයේ මතක තබා ගත යුතුය. කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය කෘෂිකාර්මික අංශයේ වෙනස්කම් ඇති කිරීමට හේතු වේ. අනෙකුත් දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, සංවිධාන සහ ස්වේච්ඡා සංවිධාන ආර්ථිකයේ නානා අංශ සංවර්ධනය කිරීම සහ වෙනස් කිරීම අරභයා කටයුතු කරයි. ග්‍රාමීය සංවර්ධනයෙහි ලා මෙකී සියළුම සංවිධාන අරමුණු වශයෙනුත් ප්‍රායෝගික වශයෙනුත් අනුකූල නොවුවහොත් ගොවියාට (හෝ ප්‍රජාවට) බොහෝ ගැටළු වලට මුහුණ දීමට සිදුවනු ඇත.[3] එසේ වුවහොත් අපේක්ෂිත සංවර්ධනය කරා ලඟා වීම ප්‍රමාද විය හැකිය.

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් කරන ලද පර්යේෂණ ව්‍යාපෘති වලට අනුව, ගොවියා සිය ගොවිපල සඳහා වැඩි යෙදවුම් යෙදවීමට හෝ නව වගා ක්‍රම භාවිතා කිරීමට හෝ තීරණය ගැනීමේදී බලපාන සාධක බොහොමයක්ම ඔහුට හෝ ගොවිපලට අදල විය හැකි සේම එයින් පරිබාහිරද විය හැකිය. ඔහුගේ හැසිරීමට බලපෑම් කළහැකි ප්‍රධාන සාධක දෙක නම් යෙදවුම් සහ වගා ක්‍රම පිළිබඳව ඔහු තුල ඇති දැනුම සහ ආකල්පයයි. එහෙත් එය වෙනස් කළ හැකිය. එසේ වෙනස් කළ හැක්කේ ඔහුට සහ ගොවිපලට පරිබාහිර ක්‍රියාවක් මගිනි. ඇත්ත වශයෙන්ම කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේදී කෙරෙනුයේ මෙම පරිබාහිර වශයෙන් ගොවියා තුල දැනීම සහ ආකල්ප හැඩ ගැස්වීමට රුකුල් දීමයි (ගුණවර්ධන සහ කණ්ඩායම; 1980). කාර්යමය වශයෙන් බලන කල කෘෂිකාර්මික ව්‍යාප්ති කටයුතු වැඩිදියුණු කිරීමේ කාර්ය භාරය සහ අධ්‍යාපනික කාර්ය භාරය වශයෙන් පුළුල් කාර්ය භාර දෙකකට බෙදිය හැකිය. වැඩිදියුණු කිරීමේ කාර්ය භාර මගින් නව තාක්ෂණ ක්‍රම යොද ගැනීමේලා ගොවියෝ උනන්දු කරවනු ලබති. අධ්‍යාපනික ක්‍රියාවලිය මගින් නව තාක්ෂණ පිළිබඳ ගොවියාගේ දැනීම සහ තේරුම් ගැනීමේ හැකියාව වැඩිදියුණු කරවනු ලබයි. (ගුණවර්ධන; 1980).

මෙරටෙහි ලිය කියවිය හැකි ජන සංඛ්‍යාව 1971 සංගණනයට අනුව මුළු ජනගහන සංඛ්‍යාවෙන් 78.5% ක් වුවත් ඔවුන්ගෙන් වැඩි දෙනෙක් ලබා ඇත්තේ ප්‍රාථමික අධ්‍යාපනය පමණී. එසේ හෙයින් යම් යම් ද තේරුම් ගැන්වීමට හෝ පිලි ගැන්වීමට බාධක බහුලය. අපැහැදිලි ව්‍යාප්ති කටයුතු මගින් ඔවුන් තුල ව්‍යාකූලත්වයක් ඇති විය හැකිය. ලෝකය සීඝ්‍රයෙන් විද්‍යාත්මක අංශයට නැඹුරු වන මෙවන් අවධියක බිහිවන නව දැනුම් සම්භාරය සැම පුරවැසියෙක්ම වෙත හඳුන්වා දීම අසීරු කාර්යයකි.[4] එකී අලුත්වන විද්‍යාත්මක දැනීම් සම්භාරයෙන් සමාජ සංවර්ධනයට අත්‍යාවශ්‍ය අංශ වෙන් කර ඒවා පොදු ජනතාව වෙත දැන ගැනීමට සැලසීම ව්‍යාප්ති සේවා මාර්ගයෙන් කළ හැකිය. කෙටියෙන් කියනවා නම් ව්‍යාප්ති සේවය යනු පර්යේෂණ හා එයින් ජනිත කෙරෙන විද්‍යාත්මක දැනීම සහ ප්‍රජාව තුළ පවත්නා දැනුම අතර පවත්නා පරතරය පිරවීමයි.

කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය මගින් කෙරෙනුයේ කෘෂිකාර්මික සංවර්ධනයට අදාල තාක්ෂණික ආර්ථික සහ සමාජයීය පර්යේෂණ මගින් බිහි කෙරෙන කෘෂිකාර්මික විද්‍යාත්මක සහ තාක්ෂණික නව දැනීම්, කෘෂිකාර්මික සංවර්ධනයට උපයෝගි කරගනු පිණිස ගොවිජනතාව වෙත ලබා දීම යයි කීම නිවැරදිය. මෙකී අරමුණු මත ග්‍රාමීය මට්ටමින් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවකයා විද්‍යාත්මක දැනීම ගොවින් වෙත ගෙන යයි. එහි අරමුණු කෘෂිකර්මාන්තයේ කාර්යක්ෂමතාවය දියුණු කිරීමයි.

**අත්හද බැලීම් තුලින් නව නැම්මක් ;**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අනුගමනය කල සාමාන්‍ය ව්‍යාප්තික කටයුතු වෙනුවට 1977 දී සිට නවතම ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබීය. මෙම ක්‍රමය පුහුණු හා ආදර්ශන ක්‍රමය (Training and Visit System—T & V System) වශයෙන් හඳුන්වයි. දැනට ලබා ගෙන ඇති තොරතුරු අනුව, දියුණු වගා ක්‍රම සහ යෙදවුම් පිළිබඳව ගොවියා ලබා ගෙන ඇති දැනුම කෙසේ ද ? ඔවුන් එම ක්‍රම, දියුණු බීජ භාවිතය හා පොහොර භාවිතය පිළිබඳව සිතන්නේ මොනවාද? යන්න ගැන සාමාන්‍ය වශයෙන් පැහැදිලි අධ්‍යයනයකින් පසුව, ඒ ඒ ප්‍රාදේශීය විෂමතා සලකා ඉහත සඳහන් නව ව්‍යාප්ති ක්‍රම උපයෝගී කර ගැනීමෙන් යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි බැව් ඔප්පු වී තිබේ. මෙම ක්‍රමයට අනුව පළමුව කෘෂිකර්ම ව්‍යාප්ති අංශය, තම කාර්යය සහ එය ඉටු කළ යුතු ආකාරය පිළිබඳව පූර්ව නිගමනයකට එළඹ සිටිය යුතුය. නොඑසේ නම්, ව්‍යාප්ති සේවකයාට තම පුහුණු පංති වලදී පරියේෂණ සහ පුහුණු අධිකාරීන් විසින් උගන්වනු ලබන දේ නැවත නැවත ගොවියන් ඉදිරියේ ද පුන පුනා කියා දීම විනා වෙන කළ යුතු දෙයක් නොමැති වනු ඇත (තෙන්නකෝන්; 1982). ව්‍යාප්ති සේවයේදී අත්‍යාවශ්‍යම සාධකය නම් පැහැදිලිතාවය වේ. තමා විසින් කියා දීමට යන කරුණු වල නිරවද්‍යතාවය සහ සරළ බව සහ තමා විසින් භාවිතා කරන සංනිවේදන මාධ්‍යයේ කාර්යක්ෂමතාවය එම පැහැදිලිකම වශයෙන් හැඳින්විය හැකිය.[5] ලෝක බැංකුවේ නිර්දේශය මත ප්‍රථමයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ අත්හද බලනු ලැබූ මෙම ක්‍රමයෙන් සතුටුදායක ප්‍රතිඵල ලැබීම නිසා එය මෙරටෙහි කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ සමස්ත ක්‍රියාවලිය බවට පත් වී තිබේ. බොහෝ දියුණුවන රටවල පවත්නා පරිදි, ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවකයාට ප්‍රමාණයට වඩා අධික ගොවියන් සංඛ්‍යාවක් සමග කටයුතු කිරීමට සිදුවේ. මෙය අසීරු කරුණක් වූවා පමණක් නොව අපේක්ෂිත වූ ප්‍රතිඵල ලබා ගැනීමට ප්‍රමාද වන්නට විය. මෙම නව ක්‍රමය අනුව ගොවියන් කාණ්ඩවලට බෙදනු ලබයි. සෑම කණ්ඩායමක්ම සම්බන්ධිත ගොවියා හෝ ආදර්ශ ගොවියා (Contact farmer) මගින් මෙහෙයවනු ලබයි. ව්‍යාප්ති සේවකයා සෑම සති දෙකකටම වරක් මෙම කණ්ඩායම මුණ ගැසෙනු ඇත. ආදර්ශ ගොවියාගේ කාර්යය පැහැදිලි සහ තීරණාත්මක එකකි. ඔහු සාකච්ඡා සඳහා තම සාමාජිකයන් (අනුගාමික ගොවියන්) රැස් කිරීම, තම අදහස් සාමාජිකයින් හා සාකච්ඡා කිරීම සහ, සෑම කණ්ඩායමම ආදර්ශවත් ලෙස යෙදවුම් සහ නිර්දේශ වගා ක්‍රම අනුගමනය කිරීම ආදී ඔහු වෙත සහයෝගීතාවයෙන් පැවරුනු කාර්යය ඉටු කිරීමට වෙන් වී සිටී. මෙය ව්‍යවස්ථික බැඳීමකට වඩා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීමක් වශයෙන් සැලකිය හැකිය (ගුණවර්ධන සහ කණ්ඩායම; 1980). මෙහිදී ව්‍යාප්ති සේවකයා ගේත් ආදර්ශ ගොවියාගේත් කාර්යක්ෂමතාවය එකසේ වැදගත් වෙති. කෘෂිකාර්මික සංවර්ධනයට බලපාන ප්‍රධාන සාධකයක් නම් ගොවිපල කාර්යක්ෂමතාවයයි. යැපුම් කෘෂි කර්මාන්තයෙන් සමාජ හා ආර්ථික සංවර්ධනයට ලැබෙනුයේ මඳ රුකුලකි. එමනිසා යැපුම් කෘෂිකර්මාන්තය දියුණු විද්‍යාත්මක කෘෂිකර්මාන්තයක් බවට පරිවර්තනය කිරීම අත්‍යාවශ්‍යයි. මේ සඳහා නවීන විද්‍යාත්මක දැනීම උපයෝගී කර ගනිමින් බෝග වගාව සහ සත්ව පාලනය දියුණු කළ යුතු වේ. දියුණු බෝග බීජ වර්ග වගා කිරීම හෝ උසස් වැඩි දියුණු කරන ලද සත්ත්ව වර්ග ඇති කිරීම; පොහොර භාවිතය; රෝග මර්ධනය; කෘමි උවදුරු මර්ධනය සහ වල් මර්ධනය; දියුණු වගා ක්‍රම අනුව ගොවිතැන් කිරීම: දියුණු ගොවිපල උපකරණ භාවිතය, මනා ජලපාලනය ආදී අංශයන්ගේ තාක්ෂනික දැනීම ගොවියා වෙත හඳුන්වාදීමෙන් කෘෂිකාර්මික

නවීකරණය කිරීමේ මුල් පියවර ඇරඹේ. නව බෝග වර්ග, කෘමි නාශක බෙහෙත් වර්ග ගැන පමණක් දැන ගැනීමට සලසා එයින් සෑහීමකට පත් විය නොහැකිය. තම ගොවිපල, ස්වාභාවික සම්පත්, යෙදවුම්, ශ්‍රමය සහ නිෂ්පාදනය යන සෑම අංශයක්ම කාර්යක්ෂමව පාලනය කර ගන්නේ කෙසේ ද යන්නත් ගොවියා දැන සිටිය යුතුය. ගොවියෝ පුද්ගලික වශයෙන් හෝ සමූහ වශයෙන් හෝ සැලසුමක් අනුව කටයුතු කළ යුතු වෙති. වියලි කලාපයේ පුරාණ ගම්වල කුඹුරු ගොවිතැන් සම්බන්ධයෙන් ගොවියෝ සමූහ වශයෙන් එක්ව සැලසුම් සකස් කරති. පසුව පස හා ජලය වැනි වටිනා සම්පත් පාලනය කර ගනිමින් ඔවුහු ගොවිතැන් කිරීමේ යෙදෙති. ඔවුහු එලදායී සම්ප්‍රදායික තාක්ෂණයන් වැඩිපුර භාවිතා කරති. ඔවුනට හඳුන්වා දෙන නව ක්‍රමය, එනම් පස සකස් කරන ක්‍රමය සහ යොදා ගන්නා උපකරණ, පසේ සාරවත් භාවය වෙනස් කිරීමට හෝ සෝදාපාලුවට හේතු නොවන ආකාරයේ විය යුතුය. එවිට වඩා උචිත තාක්ෂණය ඔවුහු තෝරා ගනු ඇත. මේ අනුව ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවකයාට තම ප්‍රදේශයේ ගොවියෝ භාවිතා කරන වගා ක්‍රම දියුණු කෘෂිකාර්මික සංවර්ධනයට අදාල දැයි සමීක්ෂණය කර බැලීමට හැකියාව සහ අවකාශ තිබිය යුතුය.

### කෘෂිකාර්මික අංශය සමග අත්වැල් බැඳගත යුතු අනෙකුත් ව්‍යාප්ති සේවා

කෘෂිකර්මාන්තයේදී ද මූල ධනය වැදගත් නිෂ්පාදන සාධකයකි. සුලු ගොවියාට මේ සඳහා ආයතනික මූලාශ්‍ර මගින් හෝ පෞද්ගලික සම්බන්ධකම් මත වෙනයම් මාර්ගයකින් හෝ ණය ලබා ගැනීම අවශ්‍ය වේ. මේ ණය මුදල් පාවිච්චි කරන්නේ කෙසේ ද ? ගොවිපල අයවැය ලේඛණයක් පිළියෙල කරන්නේ කෙසේ ද ? අවශ්‍ය ගොවිපල වාර්තා ලබා ගන්නේ කෙසේ ද ? යන වැදගත් අංශයන්ගෙන් පුහුණුවක් ද ගොවියාට අවශ්‍ය වේ. පුරාණ ගම්වල ගොවියාට වඩා ජනපදික ගොවියාට මෙකී අංශයෙන් පුහුණුවක් ලබා දීම පහසු වනුයේ ඔවුන් ඒකාකාරව ගොවිපල ඒකකයකට හිමිකම් කියන බැවිනි. පුරාණ ගම්වල බහුතර කොටසකට ස්ථිර ගොවිපලක් නැත. නවීන ගොවියාට අවට ලෝකය සමග සම්බන්ධතා වැඩිය. නවීන ගොවියාට නව තොරතුරු සහ නව ප්‍රගුණතා අවශ්‍යය. එසේ නොවුවහොත් ඔහු බලාපොරොත්තු වන ගොවිපල එලදායීතාව පවත්වාගෙන යෑම අපහසු වේ. අනෙක් අතට ගොවිපලෙන් පරිබාහිරව තම පවුලේ සුභසාධනය සහ දියුණුව උදෙසා ද ඔහුට කටයුතු කිරීමට සිදු වේ. මේ නිසා පවුල් සෞඛ්‍යය සහ එදිනෙද ජීවිතයේ අවශ්‍ය වන දැනීම සහ ප්‍රගුණතාවයන් ඔහුට තිබිය යුතුය.

මේ අනුව බලන විට පවුල් සුභසාධනයට අදාල කරුණු එනම් පවුල් සෞඛ්‍යය, සනීපාරක්ෂාව සහ පෝෂණය පිළිබඳ දැනීම සහ පුහුණුවීම ද ග්‍රාමීය ප්‍රජාව සඳහා අවශ්‍යය. මේ හා අදාල දැනීම ඔවුන් වෙත ගෙන යාම ද ග්‍රාමීය මට්ටමේ සංවර්ධන ව්‍යාප්ති සේවයේ එක් අංශයකි. සෞඛ්‍ය සම්පන්න ජනතාවක් මනා පැවැත්ම මත රඳා පවතී. කායික ශක්තිය සහ සනීපාරක්ෂාව පෝෂ්‍යදායී ආහාර නිසා සෞඛ්‍ය සම්පන්න පවුලක් නිර්මානය වන අතර එවැනි ප්‍රජාවක් වැඩි කෘෂිකාර්මික නිෂ්පාදනයක් ලබයි. පෝෂ්‍ය ගුණය බහුල ආහාර වැඩි වැඩියෙන් වගා කිරීම, ඒවා ගබඩා කර තබා ගැනීම, ආහාර පිසීම ආදී අංශයන්ගෙන් ලත් නව තාක්ෂණික දැනීම ද ගොවියා සතු විය යුතුය. ගෙදර දොර පිරිසිදුව තබා ගැන්ම, මුළුතැන්ගෙය සහ ආහාර පිසින භාජන පිරිසිදුව තබා ගැනීම, දරුවන් හදා වඩා ගැනීම ආදී සනීපාරක්ෂාවට අදල අංශයන්ගෙන් දැනුමක් ද ගොවියා ලද යුතුමය. සෞඛ්‍ය සම්පන්න උසස් නිෂ්පාදන ශක්තියක් ඇති ජාතියක් බිහි කිරීමට නම් කෘෂිකාර්මික, සනීපාරක්ෂාව සහ පෝෂණ යන ත්‍රිවිධාංගයන්ගේ ඒකාබද්ධතාවයන් සැකසුනු පුහුණු සහ ව්‍යාප්ති සේවා ග්‍රාමීය මට්ටමේදී අත්වැල් බැඳ ගත යුතුය.

කුමන ආකාරයක ග්‍රාමීය සංවර්ධන ව්‍යාප්ති වැඩසටහනක් වුව ද එය ප්‍රජා සහ සමාජ සංවර්ධන කාර්යයක් වේ. සමාජ සහ ආර්ථික සංවර්ධනය අරමුණු කරගත් එවැන්නක් ඇති කිරීමේ හැකියාවකින් යුත් සමාජ සංවිධාන ඇති කර ගන්නා ආකාරය සහ ප්‍රජා ප්‍රශ්න නිරාකරණය

කරනු වස් සාමූහිකව කටයුතු කරන්නේ කෙසේ ද යන්නත් පිළිබඳව ජනතාවට ඉගැන්වීමට සහ පුහුණු කිරීමට යොමු වූ එක්තරා ආකාරයක අධ්‍යයන ක්‍රියාවලියක් ප්‍රජා සංවර්ධනය වශයෙන් කෙටියෙන් හැඳින්විය හැකිය. ව්‍යාප්ති සේවයේ ප්‍රජා සංවර්ධන අංශය වශයෙන් විග්‍රහ කරනුයේ ප්‍රජාවගේ සමාජ සහ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කරනු වස් යොදා ගන්නා ව්‍යාප්ති ක්‍රමවේදයන්ය. ප්‍රධාන කාරණය නම් ගොවියාගේ දැන් පවතින ජීවන තත්ත්වයට වඩා උසස් ජීවන තත්ත්වයක් සඳහා අරමුණු ඔහු සිතේ ජනිත කරවීමයි. උසස් ජීවන තත්ත්වයක් සඳහා ආදායම් වැඩි විය යුතුය. ගොවියාට ලබා ගත හැකි උසස් ජීවන තත්ත්වයක් පිළිබඳව අවබෝධයක් සහ අභිප්‍රායක් නැතිනම් ඔහු වැඩිපුර මුදල් ඉපැයීම සඳහා වෙහෙස නොවනු ඇත. කෘෂිකාර්මික ව්‍යාප්ති නිලධාරීන්, ප්‍රජා සංවර්ධන නිලධාරීන්, සමාජ සේවකයන් වැනි ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති නිලධාරීන් විසින් උසස් ජීවන තත්ත්වය පිළිබඳ අරමුණු එහි වැදගත්කම සහ අභිප්‍රාය පිළිබඳ හැඟීම වර්ධනය කරනු ඇත. තම දරුවන්ට උසස් අධ්‍යාපනයක් ලබා දීම සඳහා මව්පියවරු වැඩිපුර මුදල් ඉපයිය යුතුය. ඒ සඳහා තම ආදායම් මාර්ගය මනාව සංවිධානය කළ යුතුය. ඔහු ගොවියෙක් නම්, තම ගොවිපලෙන් වැඩිපුර මුදල් ඉපැයීමට නම් ගොවිපල කාර්යක්ෂමව කළ යුතු වේ. ඒ සඳහා නවීන කෘෂිකාර්මික තාක්ෂණික දැනීම පිළිගත යුතු වේ. ග්‍රාමීය දරුවන් වඩ වඩා අධ්‍යාපනය ලැබීමෙන් උසස් ජීවන තත්ත්වයක අවශ්‍යතාවය ඔවුන් තුල ලියලනු ඇත. ජීවන තත්ත්වය උසස් කිරීමේ අවශ්‍යතාවය එය පිළිබඳ හැඟීම හා අපේක්ෂාව ලඟා කර ගනු වස් දරණ උත්සාහය ප්‍රජා සංවර්ධනයේදී ශක්තිමත් සාධකයක් වශයෙන් පෙරටුවීමට පිළිවන.

කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය ගොවියා කෙරෙහි විශාල බලපෑමක් ඇති කරන බව සැබෑය. එහෙත් එය කඩිනම් කෘෂිකාර්මික සංවර්ධනයකට බලපාන සාධක අතුරින් එකක් පමණක් බව මතක තබා ගත යුතු කරුණකි. නමුත් දක්ෂ කාර්යක්ෂම පුහුණු ව්‍යාප්ති සේවකයා එකී සාධක වෙන් වෙන්ව හඳුනා ගෙන ඒවා ප්‍රායෝගික වශයෙන් ඒකාබද්ධ කොට ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සමග ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති කටයුතු සමඟ අත්වැල් බැඳ ගැනීමේ අවශ්‍යතාවය අවබෝධ කර ගනී. මේ නිසා පෞද්ගලිකව ද, ප්‍රජා මට්ටමින්ද, ජාතික මට්ටමින් ද ආර්ථික හා සමාජයීය සංවර්ධනය වේගවත් කෙරෙනු ඇත. කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන් වලදී, ප්‍රධාන ගොවියාට එනම් ගොවි පවුලක ගෘහ මූලිකයාට වැඩි තැනක් දී ම නිතර දක්නට ලැබෙන්නකි. එයට හේතුව නම් ගොවිපල තීරණ ගනු ලබන්නා ඔහු වීමය. අප රටෙහි ගොවි පවුලක ප්‍රධාන ගොවියාට අමතරව දරුවන් හෝ ගෙදර පදිංචි සාමාජිකයින්ගෙන් අඩු තරමින් එක් අයෙක් වත් ගොවි කටයුතු වල පූර්ණකාලීනව නියැලේ. මෙම සාමාජිකයා තරුණ වයසේ අයෙකු විය හැකි අතර ඔහු තම පියාට වඩා සාමාන්‍ය දැනීමක් ඇති අයෙකු විය හැකිය. මේ නිසා ගොවිපලේ සියළුම සාමාජිකයින් ව්‍යාප්ති වැඩසටහන් වලදී සහභාගී කර ගැනීම බොහෝ ඵලදායි විය හැකිය. අධ්‍යාපනික අංශයෙන් දරුවනට ලැබෙන දැනීම බොහෝ අවස්ථාවල තම දෙමාපියන්ගේ ගොවිපල වලදී අත්හද බලන පාසැල් ළමුන් පිළිබඳ අසන්නට ලැබේ. මේ නිසා තරුණ වයසේ සාමාජිකයන් ග්‍රාමීය සංවර්ධනයේ විභවතාවයක් ඇති සම්පතක් ලෙස හඳුනා ගැනීම කාලෝචිතය. සමහර අප්‍රිකානු රටවල රැකියා පුහුණු අධ්‍යාපන යටතේ අධ්‍යයනය ලබන තරුණ ශිෂ්‍යයන් ප්‍රායෝගික පුහුණුව කෙරේ යොමු කරවනු ලබයි. සමහරු ආදර්ශ ගොවිපලවල්වල වැඩ කිරීමෙන් අධ්‍යාපනයක් ලබති. බොහෝ පාසැල් ශිෂ්‍යයන් සඳහා ප්‍රජා පාසැල් වැඩ මුළු ස්ථාන ලෙස පාවිච්චි කරති. අත්හද බැලීම් වශයෙන් ප්‍රාථමික ශිෂ්‍යයන් ගුරුවරුන් සමග ගොවි පල වලට, හස්ත කර්මාන්ත ස්ථාන වලට යැවීමෙන් පරිසරාත්මක දැනීමක් ලබා දීමට සලස්වමින්, පාසැල් ගුරුවරුන් අවිධිමත් අධ්‍යාපන වැඩසටහන් වලට සහභාගි කිරීමේ පිළිවෙලක් ද ඇති කර තිබේ.[4]

කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ සිට දේශපාලන ප්‍රචාරක වැඩ පිළිවෙලවල්, ප්‍රජා සංවර්ධන කාර්යයේ නියුතු ස්වේච්ඡා සංවිධානවලට අයත් ව්‍යාපෘති ආදී වශයෙන් නානා මාදිලියේ ව්‍යාප්ති සේවා බොහෝ සංඛ්‍යාවක් දියුණු රටවල මෙන්ම දියුණු වෙමින් පවත්නා රටවල් තුලද දක්නට ලැබේ.

ග්‍රාමීය සංවර්ධනය අරමුණු කර ගත් ව්‍යාප්ති සේවා ව්‍යාපෘති මෙහෙයවන කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයෙන් බැහැර වූ නමුත් ග්‍රාමීය මට්ටමේදී එක් විය යුතු ව්‍යාප්ති සේවා අංශ කිහිපයක් පහත සඳහන් පරිදි හඳුන්වා දිය හැකිය.

(අ) දේශපාලන පක්ෂ :

දේශපාලන පක්ෂ තම පක්ෂ අරමුණු සහ එය පොදුජන ජීවිතයට අදාල ආකාරය හඳුන්වා දෙයි. බලයේ සිටින පක්ෂය තම රාජ්‍ය ප්‍රතිපත්ති ඒවා ක්‍රියාත්මක කෙරෙන ආකාරය සහ ඒවා පොදු ජීවිතවලට ප්‍රතිලාභී වන ආකාරය පිළිබඳව ජනතාව තුල වැටහීමක් ඇති කරවයි.

(ආ) ප්‍රජා සහ සමාජ සංවර්ධන අංශ :

ප්‍රජා සංවර්ධන නිලධාරීන් කණ්ඩායම් වශයෙන් සංවිධානය වී ස්ව උත්සාහයෙන් හා දැනීම පදනම් කොට ප්‍රශ්න විසඳා ගැනීමේ උත්සාහයන් පසු ගන්වන සමාජ සහ සංස්කෘතික බාධා කවරේදැයි සොයා බලයි. සමාජ සුභ සාධන අංශ, ගෙදර දොර කළමනාකරණය සහ අරපිරිමැස්ම පිළිබඳව කියා දෙයි.

(ඇ) පශු සම්පත් සංවර්ධන සහ වන සංවර්ධන සේවා :

ඉහතින් කී ලෙස ස්වාභාවික සම්පත් සඳහා මනා කළමනාකාරිත්වයක් පවත්වා ගැනීමේ දැනීම සහ අවබෝධය ගොවියා වෙත ගෙන යයි. මෙකී කරුණු ගැන ද කෘෂිකාර්මික ව්‍යාපෘති නිලධාරියා දැන සිටිය යුතු අතර, ඒ පිළිබඳ උපදෙස් හා ප්‍රවීණතාවය ගොවියාට ලබාදීමට ද ඔහු දැන සිටිය යුතුය.

(ඈ) සෞඛ්‍ය සහ සනීපාරක්ෂක සේවා :

මූලිකම අරමුණ නම් ලෙඩ රෝග බෝවීම වළක්වා ගැනීමයි. සෞඛ්‍ය නිලධාරීන්, ව්‍යාපෘති ශිල්පීය ඥනය යොදා ගෙන සනීපාරක්ෂාව පිළිබඳ ගොවියාට උගන්වයි. එසේම පෝෂණය පිළිබඳ අධ්‍යාපනයක් ලබා දෙයි. බොහෝ ලෙඩ රෝග, විශේෂයෙන් ළදරුවන්ගේ ලෙඩරෝග වලට මන්ද පෝෂණය හේතු වෙයි. කායික ශක්තියෙන් දුර්වල පුද්ගලයා කාර්යක්ෂම ගොවි කළමනාකරණ ක්‍රම පිළිබඳව ද උනන්දුවක් නොදෙයි. පෝටීන් බහුල ආහාර මොනවා ද ? ඒවා වැඩිපුර අනුභව කිරීමේ අවශ්‍යතාවයන් මොනවා ද යන්න පිළිබඳ අවබෝධයක් පෞද්ගලික නිලධාරියා ගෙන් ලැබෙන අතර එවැනි පෝෂ්‍ය ගුණයෙන් අධික ආහාර තම ගොවිපලේ පහසුවෙන් වගා කර ගත හැකි ද ? වගා කරන්නේ කෙසේ ද ? ඒ සඳහා උචිත දියුණු වගා ක්‍රම මොනවා ද ? යන අංශයන්ගෙන් ලද යුතු ඥනය කෘෂිකාර්මික ව්‍යාප්ති නිලධාරියා විසින් ගොවියාට ලබා දෙයි.

(ඉ) අධ්‍යාපන සේවා :

ප්‍රාදේශීය අධ්‍යාපන නිලධාරීන් සමඟ ද, ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවා නිලධාරීන් විසින් අදහස් හුවමාරු කර ගැනීම ව්‍යාප්ති වැඩසටහන් වලට සහභාගි කරවා ගැනීම ආදී වශයෙන් සම්බන්ධකම් පවත්වා ගත යුතුය. පාසැල් ළමුන් සඳහා පිළියෙල කෙරුනු ප්‍රාදේශීය සම්පත් ආරක්ෂා කර ගැනීම හා ආර්ථික ලෙස ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් වූ ව්‍යාපෘතියක් මගින් ප්‍රාදේශීය අධ්‍යාපන නිලධාරීන්ගේ ද සහාය ලබා ගැනීමට ග්‍රාමීය සංවර්ධනය සඳහා මහෝපකාරී වන බව අතිශයෝක්තියෙන් කිව යුතු නොවේ.

**(ඊ) අලෙවි සේවා :**

ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවකයින් ප්‍රාදේශීය අලෙවි සංවර්ධන සංවිධාන සමග ද සහයෝගයෙන් කටයුතු කළ යුතු වේ. ව්‍යාප්ති සේවා වැඩසටහනකදී උපදෙස් ලබා ගැනීමෙන්, අදහස් හුවමාරු කර ගැනීමෙන් සහ ප්‍රායෝගික වශයෙන් සම්බන්ධ කර ගැනීමෙන් ප්‍රාදේශීය වෙළඳ සංවිධාන ප්‍රධානීන් සහ නිලධාරීන්ගේ අත්දැකීම් හා උපදෙස් ගොවිජනතාවට ප්‍රතිඵලදයි වනු ඇත. බොහෝ රාජ්‍ය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් නොයෙක් ආකාරයේ උපදෙස් ග්‍රාමීය ජනතාවට ලැබේ. එකම ගැටළුව දෙස දෙපාර්තමේන්තු සහ සංවිධාන බොහෝ විට එකිනෙකට වෙනස් ආකල්පයන්ගෙන් බැලිය හැකිය. එසේ වුවහොත් ග්‍රාමීය ජනතාවට ලැබෙන විද්‍යාත්මක ඥානය නිරවුල් එකක් විය නොහැකිය. මේ හේතු නිසා ඒ ඒ දෙපාර්තමේන්තු සහ ඒ ඒ රාජ්‍ය සහ ස්වේච්ඡා සංවිධාන වල ක්ෂේත්‍ර නිලධාරීන් ග්‍රාමීය මට්ටමේදී කණ්ඩායමක් වශයෙන් ඒකාබද්ධ වී අදහස් හුවමාරු කර ගැනීමෙන් ව්‍යාප්ති කටයුතු මෙහෙය වන්නේ නම් එය අර්ථවත් වනවා සේම ප්‍රජා සංවර්ධනයේ ඉමහත් උපාය මාර්ගයක් ද වනු නොඅනුමානය.

**ක්‍රම වේදය :**

ව්‍යාප්ති සේවා කටයුතු අධ්‍යාපන ක්‍රියාවලියක් වශයෙන් ඉහත දී පෙන්වා දෙන ලදී. එක් පක්ෂයක් ඉගැන්වීමේ කටයුතු වල යෙදී සිටින අතර අනෙක් පක්ෂය ඉගෙනීමේ කටයුතු වල යෙදෙයි. ඉගැන්වීමේ යෙදෙන පක්ෂය තම කාර්යභාරය පිළිබඳව මනා වැටහීමකින් සිටිය යුතු අතර ඉගෙන ගැනීමේ කටයුතු වල යෙදෙන පක්ෂය එවැනි කටයුත්තකට යෝග්‍ය පසු තලයක සිටිය යුතුය. කපු වගාව සම්බන්ධයෙන් බලන විට ''බෝල්වෝර්ම්ස්'' (Ballworms) කෘමියා කපු නිෂ්පාදනය අඩු වීමටත් එහි තත්ත්වය බාල වීමටත් හේතු කාරකයෙකු වශයෙන් කපු වගා කරන ගොවියා විසින් හඳුනාගත් විට එම පනුවා මර්ධනය කිරීමේ නව තාක්ෂණික පිළිවෙත් මොනවාදැයි සොයා දැන ගැනීමට ගොවියා පෙළඹේ. එවැනි අවස්ථාවක ව්‍යාප්ති සේවකයා විසින් අවශ්‍ය දැනීම ගොවියා වෙත ගෙන යනු ලැබේ. මෙවැනි දැනීම ගොවියාට හඳුන්වා දීමේදී බොහෝ ගොවියන් එවැනි ගැටළු තත්ත්වයන් අවබෝධ කර ගැනීමට අධ්‍යාපනයක් හෝ පුහුණුවක් නැති අය වීමට පුළුවන. මෙවැනි අවස්ථාවල තමා කියන දේ ගොවියාට ඒත්තු ගැන්වීම සඳහා උදහරණ, ආදර්ශන, දෘශ්‍යාධාර සහ වෙනත් අධ්‍යාපනික ක්‍රම උපයෝගී කර ගැනීමට ව්‍යාප්ති සේවකයාට සිදු වේ. ලුහුඬු පියවරේ සිට ක්‍රමයෙන් විද්‍යාත්මක තත්ත්වයේ කරුණු ගොවියාට අවබෝධ කොට දිය යුතුය. පොහොර දැමීමේ ප්‍රයෝජන ආදර්ශ ගොවිපලකදී බෝග වර්ගයක පොහොර යොදන ලද සහ නොයොදන ලද පාත්ති දෙකක සරුසාරත්වය ගොවියාට සියසින් දැන අවබෝධ කර ගැනීමට අවස්ථාව සලසා දිය හැකිය. අවශ්‍ය දැනීම සාකච්ඡා පංති වලදී සහ පුද්ගලිකව කියා දිය හැකිය. මෙම ක්‍රමය මෙතෙක් අප රටෙහි ද භාවිතා කරන ලද සාමාන්‍ය කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා පිළිවෙල වේ.

ව්‍යාප්ති සේවකයාට අවශ්‍ය දැනීම විද්‍යාත්මක පර්යේෂණ තුළින් නිතර ගෙන එයි. මෙම දැනීම එනම් තොරතුරු හුවමාරුව ''සංනිවේදනය'' වශයෙන් හැඳින්විය හැකි වෙයි. පවුල් සංවිධාන සහ සනීපාරක්ෂක ව්‍යාප්ති උත්සාහයකදී උපයෝගී කර ගන්නා සංනිවේදනය, අදහස් වෙනස් කිරීමට උපයෝගී කර ගන්නා අදහස් හුවමාරු ක්‍රමයක් වශයෙන් හැඳින්විය හැකිය. කෙටියෙන් කියතොත් පවුල් සංවිධාන සහ සනීපාරක්ෂක ප්‍රචාරක වැඩ සටහනක සංනිවේදන ක්‍රමෝපාය නම් යම්කිසි අදහසක් එහි මූලයන් ගෙන් ලබන්නෙකු වෙත ගෙන යනු ලබන, එනම් එම ලබන්නාගේ චර්යාව වෙනස් කිරීමේ හේතුවෙන් අදහස් හුවමාරු කෙරෙනු ලබන ක්‍රියාවලියෙකි (රොජර්ස්; 1973). මේ ඒ ආකාරයෙන්ම කෘෂිකාර්මික සංවර්ධනයේදී කෘෂිකාර්මික සංනිවේදන කටයුතු විග්‍රහ කිරීම සඳහා ද යොදා ගත හැකිය. කෘෂිකාර්මික ව්‍යාප්ති සේවකයා ගතානුගතික කෘෂිකර්මයේ සිට විද්‍යාත්මක කෘෂිකර්මය තෙක් ඇති වෙනස

ගොවියාට උගන්වයි. බොහෝදුරට තොරතුරු පිළිගත හැකි අවස්ථාවට අදල දැයි යන්න සහතික කර ගැනීමෙන් අනතුරුවයි අධ්‍යයනය හෝ පුහුණු වැඩ සටහනක් සඳහා යොද ගත යුතු වන්නේ. කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේදී ගොවි ජනේගේ ගැටළු සහ දියුණුවන විද්‍යාත්මක දැනීම අතර පරතරය ක්‍රමයෙන් සමනය කිරීම ව්‍යාප්ති සේවකයාගේ කටයුත්තකි. ඕනෑම ව්‍යාප්ති සේවයක කාර්යක්ෂමතාවය රඳා පවතිනුයේ තොරතුරු අදල ප්‍රජාව වෙත යොමු කරන ආකාරය අනුවය. මේ නිසා සංනිවේදනය මාධ්‍යය සංවර්ධනය සඳහා යොද ගැනීමෙදී උචිත ක්‍රියා පිළිවෙලක් තිබීම අවශ්‍යය. එසේම අනෙක් අතරට ව්‍යාප්ති සේවයේ ප්‍රතිලාභ කලින් කලට අගය කිරීමේ ක්‍රියා පිළිවෙලක් ද තිබිය යුතුය. ගොවියාගේ දැනීම එම දැනීම භාවිතා කෙරෙන ආකාරය සහ ව්‍යාප්ති සේවය මගින් ඉදිරිපත් කෙරෙන තොරතුරු පිළි ගැනුන ලැබෙන ආකාරය මැන බැලීම මගින් මෙවැනි අගැයීමක් කළ හැකිය. මේ අනුව ව්‍යාප්ති සේවකයා තෙවැදැරුම් කාර්යභාරයක් උසුලන්නෙක් හැටියට හැඳින්විය හැකිය. එනම්,

1. තම ආයතනය හෝ දෙපාර්තමේන්තුවේ චක්‍ර ලේඛණ, ක්‍රියා පටිපාටි, සහ අදහස් වලට අනුව ක්‍රියා කිරීම, නීති පර්යේෂණ මගින් ගෙනෙන නව දැනීම් එක්කාසු කිරීම, අත්හද බැලීම, සහ එම තොරතුරු වල පැහැදිලිතාවය තහවුරු කිරීම;
2. තම කාර්යය ඉටු කළ හැකි මාධ්‍ය සමඟ සම්පවීම; සහ
3. සේවයේ ප්‍රතිලාභ කලින් කලට මැන බැලීම සහ වැඩසටහන් යෝග්‍ය පරිදි නැවත නැවත සකස් කිරීම, ආදී වශයෙනි.

මෙහි දී පහත සඳහන් ප්‍රධාන සංනිවේදන මාර්ග තුනෙන් අවස්ථාවට සුදුසු පරිදි එකක් හෝ සියල්ලම උපයෝගී කර ගත හැකි ය. එනම්,

(අ) ජන මාධ්‍යය;– රේඩියෝ, පත්‍ර, චිත්‍රපට, ටෙලිවිෂන් ආදී;

(ආ) සමූහ මාධ්‍යය;– අභ්‍යාස පන්ති, රැස්වීම්, ක්ෂේත්‍ර දින ආදී;

(ඇ) පෞද්ගලික මාධ්‍යය:– ගොවියා වෙත පුද්ගලිකව ගොස් කරුණු පැහැදිලි කර දීම, ආදී වශයෙනි.

මේ කුමන ආකාරයක ව්‍යාප්ති වැඩසටහනකදී හෝ වේවා. ගොවියා වෙත ලැබෙන නව අදහස් හා දැනීම් අවබෝධ කර ගැනීම සම්බන්ධයෙන් පොදු අවස්ථා හතරක් පැහැදිලි කර දිය හැකිය.

ව්‍යාප්ති සේවයක අවස්ථා කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය ඇසුරෙන් නිදසුන් සහිතව දක්වන්නේ නම් ඒ මෙසේ ය (Bradfield; 1966).

(i) I වෙනි අවස්ථාව — ගොවියා කෘෂිකාර්මික දියුණුව සඳහා අදල නව ක්‍රම බොහෝ තිබෙන බව අවබෝධ කර ගනී. එහෙත් ඒ ගැන නිපුනතාවයක් ඔහු ලැබුවේ නැත.

(ii) II වෙනි අවස්ථාව—නව ක්‍රම ගැන දැන ගෙන අත්හද බැලීම් කරයි. උද : පොහොර යෙදීම සම්බන්ධයෙන් නම් සුළු වශයෙන් පටන් ගෙන අනුමත ප්‍රමාණ තෙක් පොහොර යොද වෙනස අවබෝධ කර ගනී.

(iii) III වෙනි අවස්ථාව — මෙම නව ක්‍රම වැදගත් යැයි ගොවියා අවබෝධ කර ගනී. ඒ පිළිබඳව තවත් ඕනෑකමින් තොරතුරු සොයා බලයි.

(iv) IV වෙනි අවස්ථාව — ඔහු ප්‍රත්‍යක්ෂ වශයෙන් දැනගත් පසු නව වගා ක්‍රම පිළිගනී. මෙම ගොවියා නවීන ගොවියා වශයෙන් හැඳින්විය හැකිය.

මෙසේ නව වගා ක්‍රම පිළිගැනීමේ සහ ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රවණතාවය ගොවියාගෙන් ගොවියාට ප්‍රජාවකින් ප්‍රජාවකට වෙනස් ය. ව්‍යාප්ති සේවකයා මෙකී ප්‍රවණතාවයක් කඩිනම් කිරීමට හේතු වේ.

**දෘෂ්ටි ශ්‍රවණ ආධාරක භාවිතය**

ඉහත දක්වූ සංනිවේදන ක්‍රම තුනෙන් ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවකයාට ඉතාම අදල වන්නේ සමූහ මාධ්‍යය සහ පෞද්ගලික මාධ්‍යයයි. තමා පැහැදිලි කරන කාරණය පහසුවෙන් ගොවියාට අවබෝධ කර ගැනීමට හැකි වනු වස් නොයෙක් වර්ගයේ දෘශ්‍යාධාර භාවිතා කිරීමට ව්‍යාප්ති සේකවයාට සිදුවේ. තමාගේ පැහැදිළි කිරීම කරගෙන යන අතර කරුණු පැහැදිලි කරුණු සඳහා අදල බෝග වගා ක්‍රමයේ ආකෘති, ඡායාරූප, කළුලැලි වල අඳින චිත්‍ර, ෆ්ලැනල් ග්‍රාෆ් සහ පිංතූර පොත් ආදී දෘශ්‍යාධාර භාවිතා කළ හැකිය. දීර්ඝකාලින වශයෙන් දැන්වීම්, බිත්තිවල අඳින සටහන් ගොවියන් වැඩිපුර ගැවසෙන ස්ථානවල තැබීම අවශ්‍ය දැනීම ගොවියා අතර බෙද හැරීමට පහසු මඟකි. ව්‍යාප්ති සේවයට සම්බන්ධ විස්තරාත්මක ග්‍රන්ථ සහ ප්‍රකාශන බෙද හැරීමෙන් සහ පින්තූර රාමු සහ චිත්‍රපටි ආදිය ප්‍රයෝජනයට ගැනීමෙන් ද ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවා කටයුතු කඩිනම් කළ හැක.

**ව්‍යාප්ති කාර්යය සහ බාධක හඳුනා ගැනීම :**

ව්‍යාප්ති සේවයේ ප්‍රජා සංවර්ධන අංශ පිළිබඳව විමර්ශනය කෙරෙන විට ව්‍යාප්ති සේවයේදී වැදගත් වන සමාජ සහ සංස්කෘතික සාධක පිළිබඳව සොයා බැලිය යුතු වේ. සමාජ ව්‍යුහය, යනු මිනිසුන් අතර සංවිධාන සහ සම්බන්ධතාවයන්ය. මෙසේ සමාජ ව්‍යුහය හෝ සමාජ සංවිධානය පවුල, කුලය, ගෝත්‍රය, ප්‍රජාව සහ සමාජය ආදී වශයෙන් සංවිධානය වී පවතී. මිනිසුන් උපන්ද සිට මරණය තෙක් වෙනස් වන අතර සමාජ සංවිධාන අභ්‍යන්තර වෙනස්වීම් තුල එසේම පැවැත්වීමට නැඹුරු වේ. සමාජය ජීවත් වන මාර්ගය හා එහි හැසිරීම සංස්කෘතිය වශයෙන් හඳුන්වනු ලැබේ. සමාජයේ එක්තරා ආකාරයක නිෂ්පාදන වශයෙන් ද අගය කළ හැකි අදහස්, ආකල්ප, රෙගුලාසි, පලපුරුදු සහ චාරිත්‍ර වාරිත්‍ර, සංස්කෘතියේ ධාවන සාධක වශයෙන් හැඳින්විය හැකිය. මෙකී සමාජ සංස්ථා හා සමාජ තුලින් බිහි වන විධිමත් මෙන්ම අවිධිමත් නායකත්වය ප්‍රාදේශීය සංවර්ධන කටයුතු වලදී ප්‍රධාන කාර්ය භාරයන් ඉසිලිය හැකිය.

මේ නිසා ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවකයා ඔහු කටයුතු කරන්නේ කොයි ආකාරයේ සමාජයක දැයි යන්න අවබෝධ කර ගෙන සිටිය යුතුය. එකී සමාජයේ සංස්කෘතික සහ සමාජ සංවිධාන පිළිබඳව අධ්‍යයනය කොට අවබෝධ කර ගැනීම ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවකයෙකුගේ ප්‍රථම කාර්ය භාරය විය යුතුය. මෙවැනි අධ්‍යයනයක් මගින් ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවකයෙකුට තම ග්‍රාමීය ජනතාවගේ විශ්වාසය සහ සහභාගිත්වය ලබා ගැනීමේ මාර්ග සොයා ගැනීමට බොහෝදුරට ආධාර වනු ඇත. මේ නිසා ව්‍යාප්ති සේවා කටයුතු වලට කිට්ටු සම්බන්ධකම් සහ බලපෑම් ඇති කල හැකි සමාජ ව්‍යුහාත්මක සහ සංස්කෘතික සාධක පිළිබඳව ප්‍රායෝගික අවබෝධයක් ව්‍යාප්ති සේවකයා ලබා තිබිය යුතුය. ස්ත්‍රී පුරුෂ භාවය අනුව ආගමික සහ ඇදහීම් අනුව නේවාසික සහ ජීවන පරිසරය අනුව, නෑදෑකම් අනුව. ප්‍රජාවන් තුල පොදු සංවිධාන බිහිවිය හැකිය. යම්කිසි වර්ගයක හෝ ප්‍රජාවක වයසින් වැඩි පුද්ගලයා එම කණ්ඩායමේ නායකයා ලෙස ද තීරණ ගන්නා ලෙස ද පෙනී සිටී. මේ ආකාරයෙන් ගමක, යායක, වයෝවෘධ ගොවියෝ එහි අවිධිමත් නායකත්වය දරති. ග්‍රාමීය මට්ටමේදී මෙවැනි නායකත්වයන් හඳුනා ගැනීම සහ ඒවා සමග සාමූහිකව වැඩ කිරිම වැදගත්ම ක්‍රමෝපාය වීමට පිළිවන.

ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සහ ප්‍රජා සංවර්ධනික ව්‍යාපෘති මගින් බොහෝදුරට සමාජයීය, සංස්කෘතික විපර්යාස කඩිනම් කෙරේ. ජනතාව ජීවත් වන මාර්ග ක්‍රම චාරිත්‍ර වාරිත්‍ර සම්ප්‍රදායික ගතිපැවතුම්, කෘෂිකාර්මික ක්‍රමෝපායයන්, වස්ත්‍රාභරණ පරිහරණය කිරීමේ විධි සහ ආහාර

පානාීය ගන්නා වත් පිළිවෙත් නේවාසික රටා යනාදිය සමාජ සංස්කෘතික අංශයන් වශයෙන් පැහැදිලි කෙරේ. සෑම සාමාජිකයෙක්ම තම සමාජයේ නව සංස්කෘතික සහ සදචාරය ගැන පෞද්ගලිකවම දැන හැඳින ඉගෙන ගනී. එහිදී තම වැඩිහිටියන්ගේ හැසිරීම සහ කතාබහ ප්‍රධාන අධ්‍යයන මාර්ගය වේ. ව්‍යාප්ති සේවයේදී හා සංවර්ධන ව්‍යාපෘති වලදී සමාජ සංස්කෘතික විපර්යාසය කඩිනම් කිරීම කෙරෙහි එය අතිශයින්ම බලපායි. සංස්කෘතිය යනු සම්පූර්ණ යෙන්ම ස්ථායි නොවේ. එය වෙනස් වන සුළු සේම වෙනස් කළ හැකි එකකි. සමාජ සංස්කෘතික විපර්යාසය යුහුසුළු කෙරෙන සහ සමාජ සංස්කෘතික විපර්යාසය ක්‍රියාවලියට බාධා පැමිණෙන සාධක මොනවාදැයි වෙන වෙනම හැඳින ගැනීම ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවකයා අනිවාර්යයෙන්ම කළ යුතු වේ.

**විපර්යාස යුහුසුළු කෙරෙන සාධක :**

පළමු සාධක වශයෙන් ''නවීකරණය වීමට'' කැමැති ගොවියෝ ගත හැකිය. මොවුන් නව අදහස් පිළිගැනීමට කැමැත්තෙන් සිටිති. ගතානුගතික සමාජයේ බොහෝ අය සැක සහිත හා ඊර්ෂ්‍යා සහගත ආකල්පයෙන්, නව අදහස් පිළිගන්නා අය දෙස බලයි. බොහෝ විට නවීකරණය වීමට නව අදහස් පිළි ගැනීමට ඉදිරිපත් වනුයේ සමාජයේ ඉතාම සුළු සාමාජික පිරිසකි. මෙම පිරිස ව්‍යාප්ති සේවා කටයුතු යුහුසුළු කෙරෙන ප්‍රබලම සාධකය වශයෙන් හඳුනා ගත යුතුය. දෙවන සාධකය වශයෙන් වෙනත් සංස්කෘතික සහ සම්බන්ධතා දැක්විය හැකිය. කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේදී අතිරේක ආහාර බෝග වගාව පිළිබඳ හඳුන්වාදීමේදී යාපනයේ ගොවියා විසින් යොදා ගන්නා නව ක්‍රම සහ උත්සාහයන් පිළිබඳව රජරට ගොවියාට සියැසින් දැක ගැනීමටත් ප්‍රායෝගික වශයෙන් පුහුණුවක් ලබා ගැනීමටත් අවස්ථාව දුනහොත්, ඔහු තම සමාජයට නව අදහස් සහ ක්‍රම හඳුන්වාදීම පිළිබඳ අතිශය ඕනෑකමින් කටයුතු කරනු ඇත. තෙවන සාධකය වශයෙන් නව සංනිවේදන මාර්ග, එනම් පාරවල් දියුණුවීම මේ නිසා නව වෙළඳපොළවල් ඇතිවීම, නව කාර්යාල ඉදිවීම, ගුවන් විදුලි යන්ත්‍ර පාවිච්චිය වැඩිවීම, පුවත්පත් කියවීම වැඩිවීම වැනි පොදු කටයුතු දැක්වේ. සිව්වෙනුව වෙනත් සාධක, එනම් අධ්‍යාපන කටයුතු, සමාජ සංවිධාන, ආර්ථික සංවිධාන සහ දේශපාලන කටයුතු ආදී සියල්ලම, සමාජ විපර්යාසය යුහුසුළු කිරීමේ අවසාන සාධකයන් වශයෙන් ඉදිරිපත් කළ හැකිය.

**විපර්යාස අඩපන වන සාධක :**

ප්‍රථම බාධකය වශයෙන් සංස්කෘතිය හා බැඳුන සාධක කිහිපයක් ඉදිරිපත් කළ හැකිය. ගතානුගතිකත්වය, සමාජ විශ්වාස සහ සමාජ උරුමයන් මේ අතර ප්‍රධාන වේ. දෙවන සාධකය වශයෙන් සමාජ බාධක ගැනේ. එයට මුල් වූ සාධක කිහිපයක් ඉදිරිපත් කළ හැකිය. පළමු වෙන්ම සමාජයේ පුද්ගලයාගේ වගකීම් සහ ඔහු විසින් ඉටු කළ යුතු කාර්ය භාර්ය පිළිබඳ සමාජ විනිශ්චය වේ. දෙවනුව ගතානුගතික උත්සව, එනම් මංගල, අවමංගල සහ ආගමික උත්සව ආදී වේ. තෙවනුව සමාජ ව්‍යුහය එනම් සමාජ සංවිධාන සහ සම්බන්ධතායි. තෙවනුව මනෝ විද්‍යාත්මක බාධක ඉදිරිපත් කළ හැකිය. එනම් බොහෝ වැසියෝ රජයේ නිලධාරීන් දෙස සැකයෙන් බලති.[6] ආදායම් බදු සහ වෙනත් බදු අය කිරීමේ යෙදී සිටින්නෝ දැයි රජයේ නිලධාරීන් දෙස සැකයෙන් විපරම් කරති. රාජ්‍ය ආධාර සහ දිරිගැන්වීම් දෙස ඔවුන් බලන ආකල්පය ද වෙනස් ය. බොහෝ ගොවියෝ මෙවැනි ආධාර සහ දිරි ගැන්වීම් කෙරෙන්නේ මන්දැයි විපරම් කරති. සිව්වෙනුව, සංනිවේදන ගැටළු දැක්විය හැකිය. ප්‍රාදේශීය භාෂා ගණනාවක් ඇති විට ව්‍යාප්ති සේවකයා විසින් භාවිතා කළ යුතු භාෂාව කුමක්දැයි යන්න තීරණය කර ගැනීම අපහසුය. ශ්‍රී ලංකාව කෙරෙහි මෙම ගැටළුව තදින් බල නොපාන නමුත් සිංහළ දෙමළ භාෂා ප්‍රාදේශීය විෂමතාවයන්ගෙන් යුතුය. මෙම විෂමතාවයන්ට අනුකූලව ව්‍යාප්ති සේවා ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වන්නේය. මාධ්‍යය පිළිබඳ ගැටළු, අයෙක් ගුවන් විදුලිය ප්‍රිය කළ හැකි අතර, තවත් අයෙක් පුවත්පත කෙරෙහි වැඩි කැමැත්තක් දැක්වීමට පිළිවන. ව්‍යාප්ති සේවයේදී භාවිතා කෙරෙන චිත්‍ර, රූපරාමු, සිනමා පත්‍රිකා, ප්‍රස්තාර, චිත්‍රපට ආදිය අවබෝධ කර ගැනීමට ශක්තියක් බොහෝ ගැමියනට නැත. කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය

සහ අනෙකුත් ග්‍රාමීය සංවර්ධන වැඩ කටයුතු පිළිබඳව සියළුම වර්ගයේ ව්‍යාප්ති සේවකයින් දැන සිටීම ඉතාම උචිතය. මේ සියළුම නිලධාරීන් සමාජ, ආර්ථික සහ සංස්කෘතික විපර්ය කාරකයන් සේ සැලකිය හැකිය. මෙම සංවර්ධන සහ විපර්යාසයන්ට බලපාන සාධක අතරින්, එකකි, ව්‍යාප්ති සේවය. එකී ව්‍යාප්ති සේවා කටයුතු අතරින් එක් අංගයකි කෘෂි කාර්මික ව්‍යාප්ති සේවය.

කෘෂිකාර්මික අංශයෙන් බලන කල ගොවියා වෙත ලැබෙන දැනීම ඔහුගේ ගොවිපල කළමනා කරණයේදී විවිධ ලෙස භාවිතා වන බව සොයා ගෙන තිබේ. එහිදී බලපානුයේ ඔහුගේ ආර්ථික තත්ත්වය සහ, ප්‍රතිලාභ පිළිබඳ අනුමාන තත්ත්වයයි. උදහරණයක් වශයෙන් ගත හොත්, වියලි කලාපයේ සමස්ථයක් වශයෙන් දක්නට ඇති ලක්ෂණයක් නම් කෘෂි උවදුරු පිළිබඳව ගොවියා තුල සැහෙන දැනිමක් තිබීමයි. බොහෝ ගොවියෝ කෘෂි මර්ධනය සඳහා නිර්දේශ කරන ලද කෘෂි රසායන ද්‍රව්‍ය අනුමත ප්‍රමාණයන් නිවැරදිව භාවිතා කරති. එහෙත් පොහොර භාවිතය කරන නමුදු නිතරම නිර්දේශ ප්‍රමාණවලට වඩා බොහෝ අඩු ප්‍රමාණයකි භාවිතා කරනුයේ. මෙය ගොවියාගේ අත්දැකීම් මත පදනම් වනවා ඇත. වර්ෂයකට කන්නයක් වගා නොකර අත හරින මෙම කුඹුරු වල දීර්ඝගිය ශාඛ ද්‍රව්‍යය පසට පොහොර කොටසක් එක් කරන බව ඔවුහු දනිති. රබර් වගාව දෙස බලන කල සුළු ගොවියන් පොහොර භාවිතා නොකරති. පොහොර භාවිතා කිරීමෙන් ඉක්මන් ප්‍රතිඵල නොලැබේ. සුළු ගොවියා ඉක්මන් ප්‍රතිඵල කෙරේ මහත් බලාපොරොත්තු තබන්නෙකි (ගුණවර්ධන; 1980). ව්‍යාප්ති සේවකයාට භෞතික හෝ සමාජයීය බාධක වලට මුහුණ දීමට සිදු විය හැකිය. පාවුදයක හෝ අනුමාන තත්ත්වයක සිටින යැපුම් ගොවියෙක් කෙරේ උසස් යෙදවුම් සහ නවීන වගා ක්‍රම පිළිබඳ හඳුන්වා දීම තරමක් අසීරු කරුණකි. ඉඩම වගා කිරීමට ප්‍රමාණවත් ජලය නොලැබේ නම්, සීඝ්‍ර දේශගුණික වෙනස්වීම් මගින් බලවත් ලෙස වගා හානි ඇති කෙරෙන විට, ගොවිපලෙන් ලැබෙන ලාභය නිතරම අස්ථිර‍ය. අනෙක් අතට දියුණුවෙමින් පවත්නා රටවල පවත්නා සමාජ ආර්ථික සංවිධානයයි. ගොවියන්ගෙන් වැඩි කොටසක් තවමත් සම්ප්‍රදයිකත්වයේ තරයේ එල්බ ගත් කොටසකි. තම මුතුන් මිත්තන් විසින් අනුගමනය කල වගා ක්‍රම හෙලා දකිනවාට ඔවුහු කොහෙත්ම අකැමැති වෙති. එසේම වැඩි කොටසක් දිළිඳු තත්ත්වයේ සිටින්නෝ වෙති.[7] ඔවුහු වෙනස් වන සමාජ ආර්ථික ක්‍රම, පවතින රජයේ අලුතෙන් නැගී එන ධනවතුන් නොරුස්නා අය වෙති. මෙම දියුණු වෙමින් පවතින රටවල අලුතින් නැගී එන ධනවතුන් සේවා අංශයේ යෙදුනෝ වෙති. ගොවියන් බහුතරය වැඩ කරන ජනතාව එම වෙළඳ සහ පාලක කාර්යයන්හි යෙදුන නැගී එන ධනවතුන්ගේ මධ්‍යය තර කරන්නෝය. ආර්ථික සංවර්ධනයේ වැඩි වාසි අත්වන කොටස ඔවුහු වෙති. බොහෝ ගොවි පවුල් සුළු ගොවියන් වන අතර ඔවුන්ගෙන් වැඩි කොටසක් යැපුම් තත්ත්වයේ ගොවි පවුල් වේ.[8] මේ නිසා ගොවියන් සහ වැඩ කරන ජනතාවගේ සහභාගිත්වය ලබා ගැනීම අපහසු වෙමින් පවතින්නක් ලෙස දැක්වීම නිවැරදිය. නිලධාරීන් නොමඟ යවන පැරණි ඉඩම් හිමියන් ගමේ සාමාන්‍ය ගොවියා හොඳ අස්වැන්නක් ලබනවාටද කවදත් විරුද්ධ අය වූහ. රජයේ කෘෂිකාර්මික ආධාර වලින් වැඩි කොටසක් මෙම ඉඩම් හිමි පොහොසත් ගොවියන් අතට ද යයි (පොල්, කුරුඳු, සඳහා)[9]. අනෙක් අතට නවීන තාක්ෂණික ක්‍රම භාවිතය නිසා ඇති වන සමාජ හානි පිළිබඳ හුවා දක්වන තවත් බුද්ධිමත් කොටසක් වෙති. මෙම බුද්ධිමත් කොටස විසින් වපුරනු ලබන සීමාන්තික බිය ගොවියා කෙරේ ඇති විය හැකිය. භෞතික වශයෙන් බොහෝ ග්‍රාමීය ප්‍රදේශ ගමනා ගමන අපහසුකම් වලින් යුක්තය. භෞතික වෙනස්වීම් නිසා ඇති වන අලාභ විඳ ගැනීමට මෙම සුළු ගොවියාට අපහසුය[10]. මේ නිසා ව්‍යාප්ති සේවකයාට අවශ්‍ය පරිදි ගොවිපලට යෑම, සහ ගොවියා සමග සම්බන්ධතා පැවැත්වීම තරමක් දුෂ්කර කාර්යයක් විය හැකිය. ප්‍රමාණවත් තරම් පුහුණු කෘෂිකාර්මික ව්‍යාප්ති සේවකයන් නොමැති මෙම අවධියේ බොහෝ ව්‍යාප්ති සේවකයන්, ගමනා ගමන පහසුකම් සහිත ප්‍රදේශ කෙරේ පමණක් වැඩි සැලකිල්ලක් දැක්වීමත් එක්තරා ගැටළුවකි (තෙන්නකෝන්; 1982).

ශ්‍රී ලංකාව කෙරෙහි බලන විට ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය (දේශීය කෘෂිකාර්මික අංශය සංවර්ධනය කිරිමේදී) ග්‍රාමීය මට්ටමේදී, කෘෂිකාර්මික උපදේශක නිලධාරීන් සහ ඔහුගේ අධීක්ෂණය යටතේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවකයන් මගින් කෙරේ. ගොවිජන සේවා එනම් කෘෂිකාර්මික යෙදවුම් සංවිධානය, ගොවි ආරාවුල් සමථයකට පත් කිරීම්, සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම, ඉඩම් නාම ලේඛණ පවත්වා ගැනීම සහ ගොවි නිෂ්පාදන අලෙවි කටයුතු කාර්යක්ෂම කිරීමට අදල සම්බන්ධීකරණ කටයුතු කිරීම ආදී විශාල වගකීමක් සහ බලපෑම් ඇති කර විය හැකි කටයුතු ගොවිජන සේවා අංශය ප්‍රාදේශීය නිලධාරියෙකු සහ ඔහුගේ අධීක්ෂණය යටතේ සංවිධානය වූ වගා නිලධාරි සමූහයක් මගින් කෙරේ. ග්‍රාමීය මට්ටමේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවකයා මෙම ගොවිජන සේවා අංශයේ කාර්ය භාරය පිළිබඳව ද මනා වැටහීමකින් සිටිය යුතුය. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවකයන් තුල (ග්‍රාමීය මට්ටමේ) ගොවිජන සේවා අංශයේ, විශේෂයෙන්ම වගා නිලධාරි කාර්ය භාරය පිළිබඳව ඇත්තේ අල්ප දැනීමකි. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කිරීම තුලින් ග්‍රාමීය සංවර්ධනයක් ඇති කරලීමට මූලික පසුබිම දැනටමත් සකසා ඇති බැවින් ව්‍යාප්ති සේවයේ සහ ගොවිජන සේවා අංශයන්ගේ සම්බන්ධීකරණයක් ගොවිජන සේවා ප්‍රාදේශීය මට්ටමින් පවත්වා ගෙන යා යුතුය යන්න මෙයින් පැහැදිලි වෙනවා ඇත.

**නිගමනය :**

ව්‍යාප්ති සේවා අධ්‍යාපනය සහ ව්‍යාප්ති සේවා කටයුතු ප්‍රජා සංවර්ධන වැඩ පිළිවෙල වල අත්‍යාවශ්‍යම අංශ බවට පත් වී තිබේ. ග්‍රාමීය ප්‍රජාව ස්ව ශක්තිය තුලින්ම, ඔවුන්ගේ කර්මාන්ත සහ ජීවන පිළිවෙත් නිසි පරිදි හැඩගස්වා ගැනීමෙන් පමණි ප්‍රජා සංවර්ධනයක් ඇති විය හැක්කේ. ඒ පිළිබඳව දැනීම හා නිපුණතාවය ඔවුන් තුල තිබුන ද, එම දැනීම සහ නිපුනත්වය ප්‍රමාණවත් නොවිය හැකිය. මෙම අවශ්‍ය දැනීම සහ යෝග්‍ය නිපුනත්වය ග්‍රාමීය ප්‍රජාවට ඔවුන්ගේ එදිනෙද ජීවන පිළිවෙතට සහ පරිසරයට පරිබාහිර දෑ විය හැකිය. ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියකදී මෙම පරිබාහිරව දැනීම සහ නිපුනතාවය, ඇති කිරීම සඳහා ව්‍යාප්ති සේවා වැඩ පිළිවෙලවල් ඇති කළ යුතුය.

මුළු ජනගහණ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකටත් වඩා ප්‍රමාණවත් කෘෂිකාර්මික නිෂ්පාදන ආදායම් මාර්ගය කොට ගත් ශ්‍රී ලංකාව වැනි රටක කෘෂිකාර්මික තත්ත්වය වැඩි දියුණු කිරීම ග්‍රාමීය සංවර්ධනය කඩිනම් කිරීමේ අත්‍යාවශ්‍ය අංගයයි. මෙහිදී කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයට ප්‍රමුඛත්වයක් ලැබේ. අප රටෙහි කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ ප්‍රබල කාර්යය බවට පත්ව ඇත්තේ නව යෙදවුම් හඳුන්වා දීම හා ඒවා භාවිතා කිරීම පිළිබඳ උනන්දුව ඇති කිරීමයි. මෙයින් පමණක් ව්‍යාප්ති සේවයට සෑහීමකට පත් විය නොහැකිය. ගොවියන් ලාභ ලබන නිෂ්පාදන කාර්යයන්හි යෙදී සිටියි. ඔවුහු ප්‍රාග් ධනයට සමාන ලාභයක් බලාපොරොත්තු වෙති. වැඩි යෙදවුම් යොද වැඩි අස්වැන්නක් ලබා ගත්ත ද, වියදම සමග සංසන්දනය කිරීමේදී ලාභාංශය සීමාසහිත විය හැකිය. මෙහිදී වැඩි යෙදවුම් භාවිතා කිරීමට ගොවියා මැලි විය හැකිය. මේ නිසා එළදව කෙරේ බලපාන විචල්‍යතා හඳුනා ගැනීම සහ මනා ගොවිපල කළමනාකරණයක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ. පිරිවැය අවම කරමින් වැඩි ලාභාංශ ලබා ගැනීමේ යෙදවුම් සහ වගා ක්‍රම නූතන ගොවියාට එළදයි විය හැකිය. අනෙක් අතට කෘෂිකාර්මික කටයුතු හා සම්බන්ධ වූ අනෙකුත් සේවා සමඟ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා කටයුතු ද අත්වැල් බැඳ ගත යුතුය. ගොවියාගේ අවශ්‍යතා සහ ඇති විය හැකි දුෂ්කරතා පිළිබඳව පැහැදිලි අවබෝධයක් ව්‍යාප්ති සේවකයා තුල එයින් ඇති වේ. පර්යේෂණ හා අත්හද බැලීම් වලින් ලබා ගන්නා නව දැනීම් ''සංක්ෂිප්ත'' සහ ''යෝග්‍ය'' ප්‍රමාණයෙන් ක්ෂේත්‍ර නිලධාරීන් වෙත ලැබෙන්නා සේම ක්ෂේත්‍ර නිලධාරීන්ගේ එදිනෙද අත්දැකීම් හා ගැටළු පර්යේෂකයන් වෙත ද දැනගැනීමට සැලසීමෙන්, යෝග්‍ය වූත්, අවිච්ඡින්න වූත් දැනීම බෙද හැරීමේ වැඩ

පිළිවෙලවල් ඇති විය හැකිය. දියුණුවන රටවල පර්යේෂණ ආයතන සේම ප්‍රජා සංවර්ධන ක්ෂේත්‍ර කටයුතු පිළිබඳ බලධාරි ආයතන ද මෙම වැදගත් පිළිවෙල කෙරේ මෙතෙක් සැලකිය යුතු පරිදි අවධානය යොමු කර නැත.

කෙසේ හෝ ව්‍යාප්ති සේවා අධ්‍යාපන ව්‍යාපෘති වලදී අරමුණ, පිළිවෙල සහ ප්‍රතිඵලය පිළිබඳ පැහැදිලි තක්සේරුවක් තිබිය යුතුය. එහෙත් එම තක්සේරුව වෙනස් නොවන සුළු එකක් නොවේ. ඒවා වෙනස්වන සුළුය. කලින් කලට සංශෝධනය කෙරෙන සුළු ඒවාය. අත්දැකීම් සහ ගැටළු ඊලඟ වැඩ පිළිවෙලේ ආරම්භය වේ. මේ නිසා ව්‍යාප්ති සේවා කටයුතු කාලීනව අවශ්‍යතා සහ අවකාශ පරිදි අගැයීමට ලක් විය යුතුය.

---

## පරිශීලනය කළ ග්‍රන්ථ
## REFERENCES


1. Bradfield, D. J. (1966) : *Guide to Extension Training*, FAO, Rome.

2. Gold, John R. (1974): *Communicating Images of the Environment*, Centre for Urban and Regional Studies. The University of Birmingham, Occasional Paper No. 29.

3. Gunawardena, A. M. T. (1980) : *Farmers Knoweldge and Perception of Improved Technology.* Colombo Agrarian Research and Training Institute Research Study No. 34.

4. Gunawardana, A. M. T. and Chandrasiri Athula, (1981) : *Training and Visit System of Extension.* Colombo, Agrarian Research & Training Institute, Occasional Publication, No. 26, Colombo.

5. Michigan State University (1982) : Linking Formal and Non-Formal Education *The NFF Exchange* Issue No. 23-1932. NFF Information Centre, College of Education, Michigan State University.

6. Mosher, A.T. (1966): *Getting Agriculture Moving, Essentials for Development and Modernization.*, New York, Agricultural Development Council.

7. Mosher, A. T. (1978) : *An Introduction to Agricultural Extenison*, New York Agricultural Development Council.

8. Rogers, Everett, M. (1973) : *Communication Strategies for Family Planning*, New York The Free Press.

9. Rogers, Everett M and Shoemaker, F. Floyd (1974) : *communication of Innovations*, New York, The Free Press.

10. Tennakoon D. (1982) : *South West Coast Drainage and Reclamation Project, An Assessment of Results*, Agrarian Research & Training Institute, Research Study No. 54, Colombo.

# සටහන්

1. විධිමත් වූ අධ්‍යාපන ක්‍රියාවලියක් වැඩිහිටියන් වෙනුවෙන් යෝග්‍ය නොවේ. විධිමත් වූ අධ්‍යාපන ක්‍රියාවලියකදී විෂය කරුණු සැලැසුම් කරනු ලබන අතර, එම කරුණු ගුරුවරයා විසින් නියත ලෙස ශිෂ්‍යයාට හදරවනු ලබයි. ශිෂ්‍යයාට ඒ පිළිබඳ ප්‍රශ්න කිරීම හා විෂය කරුණු බැහැර කිරීම කළ නොහැකිය. එම විෂය දැනීම හා එහි වටිනාකම හෝ අගය ගුරුවරයා විසින් ආරෝපණය කරන ලද්දකි. අවිධිමත් වූ අධ්‍යාපන ක්‍රියාවලියක දී අනුගමනය කරන යම් යම් අධ්‍යාපන ක්‍රම යෝග්‍ය පරිදි සකස් කරගනු ලැබේ. ග්‍රාමීය ප්‍රජාව තුළ පවත්නා විද්‍යාත්මක සහ සමාජ දැනීම් බොහෝ විට අවිධිමත් අධ්‍යාපන වැඩසටහන් වලදී – ප්‍රජාවගේ අවබෝධ සහ පලපුරුද්ද , අධ්‍යාපනික වැඩ සටහන හා සම්බන් ධ කර ගැනීමේ දී කරුණු කීපයක් පිළිබඳව සැලකිලිමත් වීමට සිදු වේ.

* ග්‍රාමීය ප්‍රජාව සතු විද්‍යා, කලාත්මක හා සමාජයීය දැනීම් වල හරයන් අවබෝධ කර ගැනීම.
* ප්‍රජාවක ඔවුන් සතු දැනීම හා පලපුරුද්ද අනාවරණය කර ගත හැකි විශ්වාසී වූ මාර්ග හඳුනා ගැනීම හා ඒ මාර්ග සමඟ විශ්වාසිතාවය පවත්වා ගැනීම ;
* ප්‍රජාව විසින්, එකී ප්‍රජාව තුළ පවත්නා දැනීම සහ පලපුරුද්ද වැදගත් කම සේම අප්‍රමාණවත්කම් ද අවබෝධ කර ගැනීමට ඉඩ හැරීම.
* ඒ ඒ විශේෂිත පරිසරය සහ අවස්ථාවලට අනුව, ප්‍රජාව වෙත ලැබිය යුතු දැනීම් සහ ඔවුන් සතු මනා පල පුරුද්ද ඒකාබද්ධ වූ, අවිධිමත් ව්‍යාපෘති ඇති කිරීමේ හැකියාව තහවුරු කර ගැනීම. (බලන්න 2 පිටුව Non–Formal Education–Selected Issues. The NFE Exchange : Issue No. 25–1982, NFE Information Centre, College of Education, Michigan State University).

2. ප්‍රජා සංවර්ධන වැඩ සටහනක, අධ්‍යාපන ව්‍යාපෘතියක යෙදුනු ක්ෂේත්‍ර නිලධාරීන් පර්යේෂණ මගින් සැපයෙන තොරතුරු නිතිප්‍රයෝජනයට ගන්නා අතර, එම ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ක්ෂේත්‍රයේදී ලබා ගන්නා අත්දැකීම් නිති පර්යේෂකයන් වෙත ලැබෙන්නට සැලසීම ද ප්‍රයෝජනවත් වේ. පර්යේෂණ ව්‍යාපෘති වලදී මෙම තොරතුරු අදල කර ගත හැකිය. එමගින් ප්‍රජාව පිළිබඳ අව්‍යාජ අවබෝධයක් පර්යේෂකයන් තුළ ද ඇති වේ. (බලන්න 2 වැනි පිටුව එම)

3. ප්‍රජා සංවර්ධනික වැඩ සටහන් යටතේ, ව්‍යාප්ති හා සංවර්ධන කාර්යයෙහි නියැලුනු ක්ෂේත්‍ර නිලධාරියා නිතරම අනෙක් ජන සංනිවේදන හා ප්‍රජා පහසුකම් වලින් වෙන් වූ පුද්ගලයන් වශයෙන් ඔහුට හැඟි යමට පුළුවන. කෘෂිකාර්මික ව්‍යාප්ති සේවක, සනීපාරක්ෂක උපදේශක, වැඩිහිටි අධ්‍යාපන ගුරුවරු, ප්‍රජා සංවර්ධන නිලධාරීන් අවිධිමත් අධ්‍යාපන ක්‍රියාවලියක නියැලී සිටී. නමුත් එකී අධ්‍යාපන කටයුතු පිළිබඳව ඔවුන් විසින් කිසිදු පුහුණුවක් නොලබා සිටිය හැකිය. ඔවුන්ට සීමා වූ විෂය දැනීම පමණක් වැඩි වශයෙන් නිපුන කරගත් අය විය හැකිය. මේ නිසා කාර්ය වශයෙන් ඒ ඒ අංශ වෙන්ව පවතිනවා සේම ඒ ඒ සේවකයන් ක්ෂේත්‍රයේ බොහෝ දුරින් තම කටයුතුවල යෙදී සිටීමට පුළුවන. (බලන්න 3 වැනි පිටුව එම)

4. යම් කිසි විශේෂිත ගැටළුවකට පිළියම් යෙදීමේදී , ක්ෂේත්‍ර නිලධාරියාට අවශ්‍ය දැනීමෙහි අඩුපාඩු තිබිය හැකිය. එයට හේතුව එතෙක් ඔහු වෙත ලැබී ඇති දැනීම එක් අංශයකට බරවීමයි. එසේම ප්‍රායෝගික පර්යේෂණ හිඟවීම් සහ ඒ නිසා ලබා ගත හැකි තොරතුරු ද හිඟ විය හැකිය.අනෙක් අතට කෙරී ඇති පර්යේෂණ හා සොයා ගැනීම් පිළිබඳ සරල විග්‍රහයක් ක්ෂේත්‍ර නිලධාරීන් වෙත නොකඩවා ලැබේ නම් ඒ මහෝපකාරී වේ. මෙම කාර්යය බොහෝ අධ්‍යාපන ආයතන විසින් නොසලකා හැර ඇති බව ද ප්‍රකට ය. (බලන්න 3 වැනි පිටුව එම )

5. ක්ෂේත්‍ර කටයුතු සැළසුම් කිරීමේ ස්ථිර පිළිවෙත් නියම කළ නොහැකිය. එසේම අවශ්‍යතාවයන් නිශ්චිත නොවේ. ඒවා වෙනස් වන සුළුය. ඒ නිසා අවශ්‍යතා කාලයෙන් කාලයට අගය කළ යුතු වේ. *Planning Non–Formal Education Projects* — The NEF Exchange Issue No. 24, 1982 — NFE Information Centre, College of Education. Michigan State University).

6. ඉඩම් හිමිනාවය සහ වත්කම් මත පදනම්වූ සම්ප්‍රදායික නායකත්වය වෙනුවට උගත්, සාමාන්‍ය පංතියේ ගොවි පවුල් වලින් පැවැත්වෙන තරුණයන් ග්‍රාමීය නායකත්වයේ පෙරමුණ ගනිමින් සිටී. පැරණි ගම්මුලාදෑනිවරු, රටේ මහත්වරු වැනි සම්ප්‍රදායික නිලධාරීන්ගේ බලපෑම් මතක ඇති ග්‍රාමීය ජනයා විසින් නිලධාරීන් සංවර්ධනයේ බාධාකාරී මන්දගාමී පිරිසක් වශයෙන් හඳුනා ගෙන ඇත. (Central Bank of Ceylon — 1975 — Survey of Economic Conditions in the Mahaweli Development Area, Colombo).

7. වියලි කලාපයේ බොහෝ ග්‍රාමීය ප්‍රදේශ මාර්ග පහසුකම් රහිතය. එසේම නිවාස සහ සනීපාරක්ෂක පහසුකම් අසතුටුදායකය. වියළි කලාපයේ කළ සමීක්ෂණයකට අනුව, නිවාස වලින් 53% ක්ම, කටු මැටි බිත්ති සෙවිලි කල වහල සහ ගොම ගාන ලද ගෙබිමකින් යුක්ත සම්ප්‍රදායී කත්වයේ නිවාසය. නමුත් දක්ෂ ගොවියන් ඔවුන්ගේ ආදයමින් යම්කිසි ප්‍රමාණයක් ගෙවල් දියුණු කිරිම සඳහා යොදයි. මේ අනුව කෘෂිකාර්මික සංවර්ධන යත් සමඟ ප්‍රජාසංවර්ධනයත් ඇති විය හැකිය. (බලන්න පිටු 84—96 එම)

8. ගොවිපල කුටුම්භයක් ගොවිපල ඒකක කිහිපයකින් සමන්විත විය හැකිය. අප රටේ සාමාන්‍ය පිළිවෙත අනුව, ගොවිපල කුටුම්භයක් ගත් කළ එය ගෙවත්තක්, ගොඩ ඉඩමක් , කුඹුරක් සහ සමහර පළාත් වල හේනක් ආදී වශයෙන් ඒකක කිහිපයකින් සමන්විත වේ.

9. සමීක්ෂණයට අනුව කුරුඳු ඉඩම් නැවත වගා කිරීමේ සහනාධාරය ලබාගත් අය අතුරෙන් ගම්බද වත් පොහොසත්කම් ඇති උදවියද සැහෙන ප්‍රමාණයක් සිටි බව අනාවරණය වී ඇත. නමුත් මෙම කොටස සහනාධාරය ලබා ගන්නා සාමාන්‍ය ගොවි පවුල් වලට වඩා එලදයි ලෙස සහනාධාර මුදල් භාවිතා කරන බව ද අනාවරණය වී ඇත. (බලන්න පිටු 152, 160 Moore M. P. *et. al.* (1980) Agricultuıe and the Society in Low Country Sri Lanka).

10. ස්වාභාවික පරිසරයේ බාධක මැද වගා කටයුතු කරන ගොවියන් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා දනීම සහ පුහුණු එදිනෙද භාවිතයේ දී අඩු වශයෙන් යොද ගනී. (බලන්න පිටු 89—90 එම)